ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"..... උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද නුඹලා බෞතිස්මකරන සේක." (ලූක් 3:16)

82 වන වෙළුම අංක 05 (971) | 2023 සැප්තැම්බර් / ඔක්තෝබර් මාස

සම්පූර්ණ කීකරුකම සහ අබණ්ඩ කැපකිරීම

ක්‍රි.ව. 1902 දී ඇන්ඩෘ ස්ටිරෙට් සූඩානයේ අභ්‍යන්තර මිෂනාරී සේවයේ නිර්මාතෘවරයා වූ රෝලන්ඩ් බිංහැම්ව තම නිවසට කැඳවීය. එසේ කැඳවමින් බිංහැම් මහතා විසින් ප්‍රකාශයට පත්කරන ලද මධ්‍යම සූඩානය සඳහා ආයාචනයක් යන පත්‍රිකාව තමා කියෙවූ බවත් ගැලවීම නොලැබූ අයට සුභාරංචිය අවශ්‍යය බව මහත් ලෙස හැගෙන තෙක් එම පත්‍රිකාව ග්‍රහණය කරගෙන සිටි බවත් කීවේය.

ස්ටිරෙට් ඖෂධ වේදියෙකු ලෙස කැනඩාවේ සාර්ථක ව්‍යාපාරයක් කර ඇති අතර ඔහුගේ වෛද්‍ය පාඨමාලාව සම්පූර්ණ කර ඇතත් ඔහුගේ විද්‍යාල ප්‍රශ්න පත්‍රවල යම් ප්‍රමාණවත් නොවීමක් හේතුවෙන් ඔහුගේ උපාධිය ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් සූඩානයේ අවශ්‍යතාවයේ අයාචනයෙන් ඔහු කොයිතරම් පෙළඹී සිටියාද කියනවා නම්. තමා සූඩානයට යා යුතු යැයි ඔහුට හැගුණි. ඔහු බිංහැම් මහතාට මෙසේ කීවේය. මම යන්න ඕනේ මනුෂ්‍යයා කියලා ඔබ සිතන්නේ නැති නම් මට ඕනේ ඔයා මගේ දේපළ ඔක්කොම විකුණලා වෙන කෙනෙක්ව සූඩානයට යවනවා බලන්න. තමාව ඉස්මතු කර ගැනීමට උත්සාහ නොදරන මේ කුඩා නිශ්ශබ්ද මනුෂ්‍යයාගේ අතිමහත් උනන්දුව ගැන බිංහැම් මහතා බෙහෙවින්ම පැහැදී සිටියේය. විශ්වවිද්‍යාල ප්‍රවේශවීම සඳහ අවශ්‍යතා සපුරාලනවා වෙනුවට බ්‍රිතාන්‍යයේ නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂ පාඨමාලාවක් හැදෑරූවොත් ඔහුගේ රැකියාව තුළ වැඩි සේවාවක් ඉටු කිරීමට හැකිවනු ඇතැයි ස්ටිරෙට් සිතුවේය.

නුඹලා මා තෝරාගත්තා නොව මම නුඹලා තෝරාගතිමි.

ඔහු සූඩාන අභ්‍යන්තර මිෂනාරි සේවයේ පෝරමය පුරවා භාර දුන්නේය. එය සේවයේ ප්‍රධාන කමිටුව වෙත ගෙනඒමෙන් පසු ඔහුගේ වයස අවුරුදු තිස්හතක් බව දැනගත්තේය. මෙවැනි වයස්වල අයව පිළිගැනීම සම්බන්ධයෙන් අනෙකුත් දූත මණ්ඩල වලින් සෝදිසිකර බැලීමට කමිටුව තීරණය කළේය. මේ අතර බිංහැම් මහතාට ස්ටිරෙට් වෙතින් කෙටි සටහනක් ලැබුණි. එහි සඳහන් වූයේ ඔහු තම ඖෂධ ගබඩා විකුණා ඇති බවත් ඔහුගේ දේපළ තොග සහ බැදුම්කර මිෂනාරි සේවය සඳහා එම මණ්ඩලයට ලබා දී ඇති බවත්, නිවර්තන වෛද්‍ය විද්‍යා පාඨමාලාවට සහභාගිවීමට ලිවර්පුල් වෙත ගමන් කරමින් සිටින බවත්, මාස 03 ක පාඨමාලාව සම්පූර්ණ කිරීමට පෙර දූත මණ්ඩල කමිටුවේ තීරණය ලැබීමට බලාපොරොත්තුවෙන් සිටින බවත්ය.

පසුව දැනගන්නට ලැබුණේ සිටිරෙට් තමාගේ සියලුම ද්‍රව්‍යමය සම්පත් මිෂනාරි සේවයට හරවා භාරදී ගමන් කළ අතර ඔහුගේ බෝට්ටු ගාස්තුව ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොමැතිවීම හේතුවෙන් ගවයන් රැගෙන යන බෝට්ටුවකින් අත්ලාන්තික් සාගරය හරහා ගමන් කිරීමට කටයුතු කර ඇති බවයි. ඒ දවස්වල හරක් රැගෙන යන බෝට්ටුවක ගමන් කිරීම භයානක අත්දැකීමක් වූ අතර සුව පහසු ජීවිතයක් ගත කළ අයෙකුට එය වඩාත් දුෂ්කර විය. මිෂනාරි කවුන්සලය තවමත් තීරණයකට පැමිණ තිබුණේ නැත. වෙනත් දූතමණ්ඩල වලින් ඔහුගේ වයසේ මනුෂ්‍යයන් තෝරා නොගන්නා බව සොයාගෙන මිෂනාරී මණ්ඩලය ඔහුව පිළිගැනීමට මැලි වූ නමුත් දූත මණ්ඩලයේ වෛද්‍යවරයෙකුගේ අවශ්‍යතාවය ඉතා විශාලව තිබුණි. ඔවුන් මෙම ගැටළුව ලිවර්පුල් හි සුඩාන අභ්‍යන්තර මිෂනාරි මණ්ඩලය නියෝජනය කරන කමිටුව වෙත පැවරීමට තීරණය කරනු ලැබුවෝය.

අබණ්ඩ කැපකිරීම

ලිවර්පුල් කමිටුව වහාම ඔවුන්ගේ විමර්ශනය ආරම්භ කළේය. ඔවුන් කම්පනයට පත් කරමින් සිටිරෙට් මුඩුක්කුවල නවාතැන් ගෙන ඇති බව දැනගත්තේය. ඔහු සෑම උදෑසනකම තම ස්වාමියා වෙනුවෙන් විවෘත බයිබලයක් අතැතිව සාක්ෂි දැරීමට, යාච්ඤා කිරීමට ඔහු සමාජයේ දිළිඳු අය අතර ජීවත්වීමට තෝරාගෙන ඇති බව දැනගන්නට ලැබුණි. එක රාත්‍රියක නිවසක් නොමැතිව සිටි මනුෂ්‍යයෙකුට රාත්‍රිය ගත කිරීම සඳහා තම ඇඳ දුන් නිසා ඔහුව මහමඟදී පහන් කණුවක් යට බයිබලය කියවනවා දකින්නට ලැබුණි.

මාස තුන අවසානයේ දී ස්ටිරෙට් ටොරෙන්ටෝ මිෂන් කවුන්සලයට කෙටියෙන් ලියා යැවුවේ තමා නිවර්තන වෛද්‍ය විද්‍යා පාඨමාලාව සම්පූර්ණ කළ බවත්, ඔවුන්ගෙන් තීරණයක් නොලැබීමට හේතුව තේරුම් ගැනීමට අපහසු වුවත් ඔහු ඊළඟ සතියේ බටහිර අප්‍රිකාව බලා යාත්‍රා කරන නැවක ගමන් කිරීමට වෙන් කරගෙන සිටින බවත්ය. ඔහු සූඩාන අභ්‍යන්තර මිෂනාරී සේවා මධ්‍යස්ථානය වෙතට ගොස් තමාව පිළිගත්තා ද , ප්‍රතික්ෂේප කළා ද කියා දැනුම් දෙන ලෙස එහි අධිකාරිවරයාගෙන් ඉල්ලා සිටියේය.

මිෂනාරී කවුන්සලය ස්ටිරෙට්ව පරිවාස මෙහෙයුමට ගැනීමට ක්ෂේත්‍ර අධිකාරිවරයාට යොමු කිරීමට තීරණය කළේය. මනුෂ්‍යයෙක් සේවයට ගබඩා දෙකක් පවරාද, ඒවා ඉහළින් මහල් හතරක් සහ ඩොලර් දහස් ගණනක් වටිනා තොග සහ බැදුම්කර ලබා දී තමාව පිලිනොගත් සේවයකට යන බව තේරුම් ගැනීමට ඔවුන්ට අපහසු විය. පසුව ඔහු පාඨමාලාව ගැන අවධානය යොමු කර සේවය ගැන කනස්සල්ලවී සේවය අතහැරයාමට යොමු විය හැකි බැවින් ඔහු ලියා දුන්නා වූ වතුයාය ඔහු වෙනුවෙන් නැවත පවරාදෙන ලෙසත් ආදායම ඔහුට ලැබෙන්නට සලස්වන ලෙසත් මිෂනාරි මණ්ඩලය යෝජනා කළේය.

මේ මුළු කැපකිරීමේ කාර්යය තුළ ඔවුන් මනුෂ්‍යයාගේ හෝ දෙවියන් වහන්සේගේ ආත්මය තේරුම් ගත්තේ අල්ප වශයෙනි. ඔවුන්ගේ ලිපියට පිළිතුරු වශයෙන් ස්ටිරෙට් ලියා ඇත්තේ බාර්ණබස් තම ඉඩම විකුණා මුදල් අපෝස්තුළුවරුන්ගේ පාමුල තැබීමට පෙළඹුණු ආකාරයටම තමා සතු සියල්ලම

ඇන්ඩෘ ස්ටිරෙට් විසිනි.

මිෂනාරි සේවයට පැවරීමටත් බාර්ණබස් තම ජීවිතය ගත කළ ආකාරටයම සහ අනෙකුත් මිෂනාරිවරුන් මෙන් ඇදහිල්ලෙන් තමන්ටද ජීවිතය ගත කිරීමට හැකිවේ යැයි හැගුණ බවත්ය. කෙසේ වෙතත් මිෂනාරි කවුන්සලය ඔහුගේ දේපල විකුණන්නේ නැතිව ඔහු පළමු දීර්ඝ නිවාඩුවෙන් හැරී එන තෙක් ඒවා තබාගත්තේය. ඒ කාලය තුළ දී ස්ටිරෙට් මුළු වත්කම මිෂනාරි සේවයට අයිතිය පවරා ඔප්පුව සෑදූ බව දන්වනු ලැබීය. ඊළඟ වසරවලදී ඔහුගේ කුඩා දීමනාවෙන් නව සේවකයන් කිහිපදෙනෙකු මිෂනාරි සේවය සඳහා යැවීමට ඩොලර් සියයක් එවනු ලැබීය.

කුඩා ශක්තිමත් සහ කැපවූ

ස්ටිරෙට් ශාරීරිකව කුඩා වුවත් ශක්තිමත් බව ඔප්පු විය. අධ්‍යාත්මික වශයෙන් ඔහු ක්‍රිස්තුස් වහන්සේ වෙතට මනුෂ්‍යයන්ව දිනාගැනීමට කැපවී සිටියේය. ඔහු විශ්‍රාමයාමට පෙර සෑම රාත්‍රියකම සුභාරංචිය දේශනා කිරීම හෝ යමෙකු සමඟ කථා කිරීම ඔහුගේ වෙනස් කළ නොහැකි පුරුද්දක් විය. ඔහු නිරන්තරයෙන් වෙළඳ කඳවුරුවලට පැමිණ ඔහුගේ පුද්ගලික සාක්ෂිය අවංකව සහ දෙවියන් වහන්සේගේ කරුණාවන්ත ක්‍රියා ප්‍රකාශ කළේය. ඔහුගේ පළමු ධූරකාලය අවසන්වීමට බොහෝ කාලයකට පෙර තවලම් (ගැල්) ගමන් කරන්නා වූ මාර්ගය ඔස්සේ ඔහුගේ නම පැතිරී ගියේය. නිවාඩු කාලය තුළ ඔහු සිය වෛද්‍ය අධ්‍යාපනය අවසන් කර වෛද්‍යවරයෙකු ලෙස නැවත නයිජීරියාවට ගියේය. ඒ කාලය තුළ ඔහු එක් එක් මිෂනාරි මණ්ඩලවලට තෝරා ගැනීම සඳහා සුභාරංචිය ළඟා නොවූ ගෝත්‍ර දොළහක් හරහා මාස දෙකක කැපවූ (වෙහෙසකර) ගමනක් සාදනු ලැබීය.

සුභාරංචිය නොදන්නා වූ මනුෂ්‍යයන් වෙත එය ගෙන යාම ඔහුගේ ආශාවයි. වෙන කිසිම දෙයක් ඔහුට වැදගත් නොවීය. මෙම ගෝත්‍රවලින් එකකට හෝ ගොස් මුළු ජාතියකටම සදාකාල ජීවනයේ දොරගුළු හැරීමට ලැබීම මොනතරම් උතුම් වරප්‍රසාදයක්ද ... ? ස්ටිරෙට්ගේ පුරෝගාමී මිෂනාරි චාරිකා දෙස ආපසු හැරී බලන විට ඔහුගේ මිතුරෙකු මෙසේ අදහස් දැක්වීය. "ඔහු ලිවින්ග්ස්ටෝන් මෙන් ගවේෂකයෙකු නොවූ නමුත් ඔහු සාමාන්‍ය සංචාරකයෙකු ද නොවීය. "

ඔහු සාමාන්‍ය වෛද්‍යවරයෙකු නොවීය. ඔහුගේ වෛද්‍ය දායකත්වය වෙනුවෙන් බ්‍රිතාන්‍ය රජය ඔහුට පිළිගැනීමක් ලබා දුන්නේය. ඔහු බටහිර අප්‍රිකානු රෝග සඳහා ප්‍රතිකාර කිරීමට බලයලත් අත්පොතක් ලිවීය. ඔහු වර්ධනය වන සුඩාන අභ්‍යන්තර මිෂනාරි වෛද්‍ය සේවයේ බෙහෙත්ශාලා අධීක්ෂණය කළ අතර මිෂනාරිවරුන්ට සහ ඔවුන්ගේ දරුවන්ට පවුලේ වෛද්‍යවරයා විය.

ඔහු තමාගේම බෙහෙත් ශාලාවක් පවත්වාගෙන ගිය අතර ඖෂධවේදියෙකු ලෙස මිෂනාරි දූත මණ්ඩල සායන සඳහා ඖෂධ සකස් කළේය.

2 පිටුවට

1 පිටුවෙන්

සම්පූර්ණ කීකරුකම සහ අඛණ්ඩ..

දේශනා කිරීමට ආශාවක්

නමුත් සිට්රෙට් ඔහුගේ දේශනා කිරීම සහ පුද්ගලික සාක්ෂිය සඳහා වඩාත් ප්‍රසිද්ධ විය. ඔහු විශිෂ්ඨ දේශකයෙක් නොවූවත් සුඩාන අභ්‍යන්තර මිෂනාරි සේවයේ නායකයා වූ "ගයි ප්ලේෆෙයාර්" නිරීක්ෂණය කළේ දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨකම ඔහු නොනැවතී දේශනා කළ බවයි. අපගේ ඇස්තමේන්තුව නම් ඔහු විසිදහස් වාරයකට නොඅඩු වාරයක් දේශනා කර ඇති අතර අවම වශයෙන් මිලියන එකහමාරක්වත් ඔහුට සවන් දුන් බවයි. එවැනි මනුෂ්‍යයන් දෙදහසකට ඕනෑම පරම්පරාවකදී ලොව පුරා ඉවැන්ජලිස්ත සේවය කිරීමට හැකිය.

සිට්රෙට්ගේ ජීවිත කාලය පුරාම සේවය සඳහා වූ චේතනාව වූයේ ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳව ඔහුගේ අපේක්ෂාවයි. මට කවදාවත් කැඳවීමක් තිබුණේ නැහැ කියා නිතරම ඔහු පවසන නමුත් ඔහුව මෙහෙයවනු ලැබුවේ ශුද්ධ ලියවිල්ලේ ආඥාව සහ සුභාරංචිය නොලැබූ අය කෙරෙහි ඔහුගේ දැඩි සැලකිල්ලයි. ඔහු වෙතට එන්න කියා ඔහු තරුණයන්ගෙන් ඉල්ලා සිටියේය. ස්වාමීන් වහන්සේ ඉතා ඉක්මනින් පැමිණෙන අතර ඔබට නියත වශයෙන්ම උන්වහන්සේව හමුවීමට සිදුවනු ඇත. උන්වහන්සේට ඔබව සොයා ගැනීමට හැකිවන්නේ ඔබගේ සැප පහසු පුටුවේ වාඩි වී සිටින විටදීද ... ? ඔබට අවශ්‍ය වන්නේ එයද ...?

හවුසා ගෝත්‍රය ඔහුගේ පළමු ආදරය විය. ඔවුන්ට ඔවුන්ගේම භාෂාවෙන් බයිබලය තිබෙනවා දැකීම ඔහුගේ සිහිනය විය. ඔහු පරිවර්තන කමිටුවේ ප්‍රධාන සාමාජිකයෙක් විය. 1932 දී බ්‍රිතාන්‍ය සහ විදේශීය බයිබල් සංගමය විසින් සම්පූර්ණ කරන ලද හවුසා බයිබලය ඔහුගේ අතේ තිබුණු දිනය ඔහුගේ ජීවිතයේ ඔටුන්න ලැබුණු දවස විය.

දැඩි පුද්ගලික විනයක් ඇති මනුෂ්‍යයෙකු වූ ස්ට්රෙට් කලාතුරකින් ඔහුගේ හැසිරීම් රටාව වෙනස් කළේය. යාච්ඤාවෙන් දණින් වැටීමට පෙර හිරු උදාවීමට ඉඩ නොතැබීමට අධිෂ්ඨාන කරගත් ඔහු සෑම දිනකම අළුයම 3.45 ට (ගමන් කරමින් සිටින විටදී පවා) දෙවියන් වහන්සේව හමුවීමට නැගිට සිටියේය. ඔහු ඔහුගේ අප්‍රිකානු ජනතාව වෙනුවෙන් දෙවියන් වහන්සේට කන්නලව් කිරීමට නිරාහාරව සිටීම සහ යාච්ඤා කිරීම සඳහා නිශ්චිත දිනයන් වෙන්කරගනු ලැබුවේය. ඔහු නයිජීරියාවට පැමිණියේ එක් පෙට්ටියක් සහ ගමන්මල්ලක් සමඟ වන අතර ඔහුගේ කාලය ගත කළේ අරපිරිමැස්මෙන්ය. ඔහු කැඳ සහ නැවුම් පළතුරු වැනි සරල දේ ආහාරයට ගත් අතර සෑම දිනකදීම අළුයම ආරම්භයේ දී ඔහුගේ දෛනික ඇවිදීම සඳහා පිටත්ව ගියේය.

ඔහුගේ මුළු ජීවිත කාලයම තනිකඩයෙක් වූ අතර ඔහු තම නිවසේ සම්බන්ධතාවයන් වලින් වෙන්වීම කොයිතරම් සම්පූර්ණ වුනාද කියනවා නම් ඔහුට නිවාඩු ගැන එතරම් සැලකිල්ලක් තිබුණේ නැත. ඔහු මධ්‍යම සුඩානයේ මිෂනාරි සංගමය සමඟ ගතකළ අවුරුදු හතලිස් හයෙන් අවුරුදු හතලිස් එකක්ම ගත කළේ අප්‍රිකාවේය.

හවුසා ගෝත්‍රය ගොඩ නැගීම සහ පරිවර්තනය පිළිබඳ උනන්දුවෙන් වෙළඳපොළේ දිනපතා දේශනා කළේය. සෑම දිනකම සැතපුම් දෙකක් ඇවිදීමට ඔහුගේ වයස ඔහුට බාධාවක් වූ විට ඔහු වාහන රියදුරෙක් ඉල්ලා සිටි අතර වයස අවුරුදු අසූතුනේදී ඔහු මිය යාමට පෙර දිනය දක්වාම තම මිෂනාරි සේවයේ කාර්යයන්වල යෙදී සිටියේය. 1948 ජූලි මාසයේ ඔහුගේ ඇඳ අසල සිටි ඔහුගේ ස්වාමීන් වහන්සේ සමඟ කථා කරමින් සිටි බව සොයා ගන්නා ලදි. ඔහු කෙටි අවදිවීමකට යොමු වූ අතර පසුව ස්වාමීන් වහන්සේ තුළ සාදාකාලයටම සැතපුණේය. ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් අප්‍රිකාවේ වසර හතලිස් හයක් සේවය සම්පූර්ණ කළ පසු ඔහු මේ ජීවිතයෙන් සමුගත්තේය.

ආත්මයේ පැවැත්ම සහ බලය උදෙසා යාච්ඤා කිරීම

(රිවි කාර්මයිකල් විසිනි.)

අප ජීවත්වන්නේ තීරණාත්මක අවධියක බව අප වටා නපුර වර්ධනයවීම, අවනීතිය, රැවටීම, පාපය සහ ආත්මික අන්ධකාරය වැඩිවීම තුළින් පෙනෙන්නේය. අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන්නේය. (2 තිමෝති 3:1, මතෙව් 24:7-13) ප්‍රේරිත වූ පාවුල් සහ බයිබලයේ අනෙක් ස්ථානවල අපට අනතුරු අඟවා ඇති බැවින් මෙම වැඩිවීම් ඇත්තටම පුදුමයට කාරණයක් නොවේ. ආත්මික සටනක් ඇවිලී ඇති අතර අපගේ විරුද්ධකාරයා වන යක්ෂයා ඔහුගේ කාලය කෙටි බව දනී.

සැබවින්ම මේ සියල්ලම සැලකිල්ලට ගත යුතු කාරණා වේ. නමුත් සභාවට විරුද්ධව පාතාලයේ දොරටු නැගිටින්නේ නැති බව දැන ගැනීම කොයිතරම් හොඳද ... ? (මතෙව් 16:18) ඇදහිලිවන්තයන් වශයෙන් අපි ස්වාමීන් වහන්සේ තුළ ද උන්වහන්සේගේ බලවත්කමෙහි ද බලවත් බවත්, දෙවියන් වහන්සේගේ යුධායුධ වලින් සැරසී සිටින බවත්, නපුරු දවසේ දී අපට ඔරොත්තු දී සිටීමට හැකි බවත් දැන ගැනීම කොයිතරම් හොඳද ...? (එපීස 6:10-18) අපේ දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය සියල්ල කෙරෙහි පවතින බවත්, උන්වහන්සේගේ අරමුණ සම්පූර්ණයෙන්ම ඉටුවන බවත් දැන ගැනීම කොයිතරම් හොඳද ...? ස්වාමීන් වන ක්‍රිස්තුස් යේසුස් වහන්සේ රජුන්ගේ රජු සහ ස්වාමීන්ගේ ස්වාමියා ලෙස ඉක්මනින් උන්වහන්සේගේ සියලු තේජසින් යුක්තව නැවත පැමිණෙනු ඇත. නපුර සඳහටම දුරු කරනු ඇත.

එබැවින් අප අවට පවතින තත්ත්වයන් ගැන අපි දුක්විය හැකි අතර එළඹෙන සියලු මහිමය කෙරෙහි අපගේ හදවත් තබන විට අපගේ බලාපොරොත්තුව පිරී පවතිනු ඇත. මෙය බියවී සිටීමට කාලය නොවන බවත් අප අපට ඇති ලෝකයට බලපෑම් කිරීමට ඇති අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කාලය බවත් අපි තේරුම් ගනිමු. **"දවස් නපුරු බැවින් ප්‍රස්ථාව අල්ලා ගනිල්ලා"** (එපීස 5:16) අපි පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකයයි. (මතෙව් 5:13-16) අපව කැඳවනු ලබන්නේ ..., **"චංක වූ, හිතුවක්කාර වූ, පව්පරාවක් අතරේ නුඹලා නිදොස්ව, අහිංසකව දෙවියන් වහන්සේගේ නිර්දෝෂ දරුවන්ව සිටින පිණිස, කෙඳිරිවි ද, විවාදද නැතුව සියල්ල කරපල්ලා. ඔවුන් අතරේ නුඹලා ජීවනයේ වචනය පාමින් ආලෝකවල් මෙන් ලෝකයෙහි දක්නා ලබන්නහුය."** (පිලිප්පි 2:14 -15)

අපගේ කැඳවීමේ මෙම අත්‍යාවශ්‍ය අනර්ඝ කාරණා ලැයිස්තුව සැලකිල්ලට ගන්න. **"එක්නිසාද සියලු මනුෂ්‍යයන්ට ගැලවීම ගෙනෙන්නා වූ දෙවියන් වහන්සේගේ කරුණාව ප්‍රකාශ වී තිබේ. අභක්තිකකමද ලෞකික තෘෂ්ණාවද එපාකර ආශිර්වාදලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේගේ ද, අපගේ ගැලවුවිකාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින් සිහියෙන් යුක්තවද ධර්මිෂ්ඨ ලෙසද, භක්තිවන්ත ලෙසද මේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප දැනුවැති කරන්නේය. උන්වහන්සේ සියලු අධර්මිෂ්ඨකම් වලින් අප මුදා යහපත් ක්‍රියා ගැන ජවලින වූ සෙනඟක් ස්වකීය සම්පතක් කොට පවිත්‍ර කරගන්න පිණිස අප උදෙසා තමන්ව දුන් සේක. "** (තීතස් 2:11-14) අපි උන්වහන්සේගේ අනර්ඝ වූ ලේ වලින් මුදාගනු ලැබූ උන්වහන්සේගේ කරුණාවෙන් ගැලවී ස්වාමීන් වහන්සේගේම විශේෂ වූ සෙනඟ වී සිටින්නෙමු. අපගේ ජීවිත භක්තිවන්තකමින් යහපත් ක්‍රියාවලිය උන්වහන්සේගේ මහිමය උදෙසා පිරිවිය යුතු හෝරාව මෙයයි.

අස්වාභාවික උපක්‍රමය

අපි ජීවත්වීම සඳහා සහ ස්වාමීන් වහන්සේගේ මහිමය උදෙසා ඵලදැරීමට අනිත් මනුෂ්‍යයන්ව ස්වාමීන් වහන්සේ වෙතට ගෙන ඒමට ඔවුන් තුළ යමක් දැකිය යුතුය. අපගේ ජීවිත කෙරෙහි ස්වාමීන් වහන්සේගේ ස්පර්ශය හැර අන් අයට බලපෑම් කිරීමට අප බලාපොරොත්තුවක් නැත. සැබවින්ම උන්වහන්සේ නැතිව අපට කිසිවක් කළ නොහැකිය. (යොහාන් 15:5) අපට අපගේම ශක්තියෙන්, හැකියාවෙන් සහ උපක්‍රම මත යැපීමෙන් ක්‍රියා කළ නොහැකිය. නමුත් අපට අවශ්‍ය වන්නේ **"ජීවී සිව්බෙලා"** පළමු පිටුවේ සඳහන් කළ පණිවිඩය පරිදි "ස්වර්ගයෙන් යමක්" වන ස්වාමීන් වහන්සේට පමණක් සැපයීමට හැකි වූ ගින්න සහ ශක්තියයි. අපට ප්‍රඥාව, බලය, දයාව සහ දේව භක්තිය යන ස්වභාවික නොවූ පියවර අවශ්‍ය වේ. අප තුලින් ජීවන ජලය ගලායන්නා වූ ජීවන ජලය ඇති ගංගාව අපට අවශ්‍ය වේ. (යොහාන් 7:38) අපට ශුද්ධාත්මයාණන් වහන්සේ ඵල ඇති ජීවිත අවශ්‍යව තිබේ. **"නුවුත් ආත්මයාණන් වහන්සේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳුදේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත."** (ගලාති 5:22-23)

අපගේ ජීවිතවලට අවශ්‍ය සියලු දේවලින් අපව පුරවා ගැනීමට වඩා ස්වාමීන් වහන්සේව අපට බොහෝ සෙයින් අවශ්‍යව තිබෙන නිසා ස්තුතිවේවා. ඒ ඩබ්. ටෝසර් ඔහුගේ ලිපියෙන් අපට ඒ බව මතක්කර දෙනු ලබයි. අපගේ දෙවියන් වහන්සේ අසීමිතව සහ අසීමිත ආදරය, දයාව ඇතුලු අසීමිත සම්පත් ඇතිව සිටින සේක. සැබවින්ම අපේ දෙවියන් වහන්සේ ..., **ඉතින් අප තුළ ක්‍රියාකරන්නා වූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැමදේට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තා වූ තැනැත්තාහන්සේටම සියලු පව්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ සදාකාලයටම ගෞරවය වේවා....! ආමේන් !"** (එපීස 3:20-21) උන්වහන්සේ වෙතට ළංවන විට උන්වහන්සේ අපට ළංවන බව පොරොන්දු වී තිබෙන සේක. (යාකොබ් 4:8) උන්වහන්සේ

3 පිටුවට

"…. වතුර නැති වියැලුණ, වෙහෙස උපදවන්නා වූ දේශයකදී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය…. " (ගීතාවලිය 63:1)

2 පිටුවෙන්

ආත්මයේ පැවැත්ම සහ බලය..

ක්‍රියා කරන ආකාරයටම උන්වහන්සේගේ බලයෙන්, ජීවනයෙන් සහ ප්‍රේමයෙන් අපව පුරවන සේක.

ශුද්ධාත්මයාණෙන් වහන්සේගේ සේවය

මේ සියල්ලටම අත්‍යාවශ්‍යය යතුර වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ සේවයයි. යේසුස් වහන්සේ මුල් ගෝලයන්ට පැවසුවේ ... **“නුඹත් ශුද්ධාත්වයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැවිණී කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද වුළු යුදයෙහිද, සමාරියෙහිද, පොලොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක.”** (ක්‍රියා 1:8) ඔවුන් බලාසිටීම සහ යාච්ඤා කිරීමට විශ්වාසවන්තව සිටි අතර පෙන්තකොස්ත දවසේ දී ඔවුන් මත ශුද්ධාත්මයාණන් වහන්සේව වැගිරවීමට ස්වාමීන් වහන්සේ විශ්වාසවන්තව සිටි සේක. (ක්‍රියා 2:1-4) එමෙන්ම ඔවුන්ව ආත්මයෙන් පුරවාලීමට (ක්‍රියා 4:31) සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීම සහ බලය සමඟ ඔවුන් ලෝකය උඩු යටිකුරු කරන බවට චෝදනා ලබන තරමට ඔවුන් අවට සංස්කෘතියන්ට බලපෑම් කිරීමට පටන් ගත්තෝය. (ක්‍රියා 17:6)

අප ගැන කිව හැකි වන්නේ කුමක්ද ...? අද දවසේ දී ආත්මයාණන් වහන්සේගේ පැමිණීම සහ බලය සඳහා බලාසිටීමට හා යාච්ඤා කිරීමට අපි කැමතිද ...? යේසුස් වහන්සේ උගන්වන පරිදි අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ ආත්මයාණන් වහන්සේව ලබාදීමට ත්‍යාගශීලීව සිටින සේක. **“ මෙසේ නපුරුව නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දනිවු නම්, කොපමණ වැඩියෙන් නුඹලාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙන සේක්ද‍යි කී සේක.”** (ලූක් 11:13) යේසුස් වහන්සේ තවදුරටත් මෙසේ පොරොන්දු වූ සේක. "මම ද නුඹලාට කියමි. ඉල්ලාපල්ලා එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා එවිට නුඹලාට සම්බවේ. තට්ටු කරපල්ලා එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ. (ලූක් 11:9-10) ස්වාමීන් වහන්සේ, උන්වහන්සේගේ ශුද්ධාත්මයෙන් පිරී ඉතිරී යන තෙක් අපව පුරවන තුරු අපට ඉල්ලා සිටීමට, සෙවීමට සහ තට්ටු කිරීමට කාලය මෙය නොවේද ..? උන්වහන්සේගේ බලයෙන් අපව පුරවාලීමට අපට උන්වහන්සේව අවශ්‍ය නොවේද ..? උන්වහන්සේගේ ඵල, දීමනා සහ සියලු සත්‍යතාවයන්ට මඟපෙන්වන ආත්මයාණන් වහන්සේව ආවශ්‍යය නොවේද? (යොහාන් 16:13) දෙවියන් වහන්සේගේ වචනය කථා කිරීමට නිර්භීතකමෙන් අපව පුරවාලීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේව අපට අවශ්‍ය නොවේද ..? (ක්‍රියා 4:31) අපව විශුද්ධ කිරීමට ශුද්ධකමේ ආත්මය අවශ්‍ය නොවේද ..? (රෝම 5:15-16 , 1 කොරින්ති 6:11)

දෙවියන් වහන්සේගේ ආශිර්වාදය සඳහා යාච්ඤා කිරීම

මෙම අවසාන සටහනේ මෙම ගැටළුවේ කේන්ද්‍ර කොටසෙහි ශුද්ධකමට පැමිණවීම ප්‍රධාන තේමාවකි. මෙය අත්‍යාවශ්‍ය තේමාවක් ලෙස අපි වටහාගෙන සිටින අතර චාර්ල්ස් එච්. ස්පර්ජන්ගේ විශිෂ්ඨ ලිපියක් ඇතුළුව මෙම ලිපි ඔබ සමඟ බෙදා ගැනීමට අවස්ථාව ලබා දීම ගැන අපි ස්වාමීන් වහන්සේට කෘතඥවන්නෙමු. අපගේ හදවත්වල ඇති ආකරයටම මෙම පණිවිඩය හරහා ස්වාමීන් වහන්සේ ඔබගේ සිත ස්පර්ශ කරන ලෙස අපි යාච්ඤා කරන්නෙමු. මේ අන්තිම දවස්වල ජීවත්වන සහ සේවයේ යෙදී සිටින විට ඔබේ සහ අපේ ජීවිත තුළ ඒවා ක්‍රියාත්මක කරන ලෙස ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලා සිටින යාච්ඤා දෙකක් පහතින් සඳහන් කරන්නෙමු.

“වේ නිසා ස්වර්ගයෙහිද, පොළොවෙහිද ඒ ඒ ග්‍රෝත්‍රයට නම් දෙන්නා වූ පියාණන් වහන්සේට වම මාගේ දණ නමා උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණාකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්, ඇදහිල්ල කරුණාකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය කරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් අද පිහිටා සිට, දෙවියන් වහන්සේගේ වුළු පූර්ණකමට පූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, උස, ගැඹුර කිවෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි.” (එපීස 3:14-19)

“එබැවින් අපිත් ඒ ඇසූදා පටන් නුඹලා උදෙසා නොකඩවාම යාච්ඤා කරමින්, නුඹලා සියලු ආකාර ප්‍රඥාවද, ආත්මික නුවණද, ලබන ලෙස උන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමෙන් පූර්ණ වී, සියලු යහපත් ක්‍රියාවලින් ඵල දරමින් ද, දෙවියන් වහන්සේ දැන ගැනීමෙහි වර්ධනය වෙමින්ද, ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත්, ඉවසිලිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද, ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුස්සන් කළා වූ පියාණන් වහන්සේට ස්තුති කරමින් ද, නුඹලා ස්වාමීන් වහන්සේට ඛඩින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන ලෙස ඉල්ලමුව.” (කොලොස්සි 1:9-12)

කැඩුණු නමුත් පිරවූ හාජනයක්

චීනය තුළ ඔවුන් පුවත්පත් භාවිතා කිරීමට පෙර කතාන්දර කීම ඉතා ජනප්‍රිය විය. ජනතාව භාහිර තොරතුරු ලබාගත් එකම මාර්ගය එය වූයේය. කතාන්දරකරුවෙකුට දේශීය හෝ විදේශීය පැරණි හා නවීන සෑම දෙයක්ම පැවසීමට හැකි විය. කතාන්දරකරුවෙකු ලෙස "වැන්ග් ෆූ ලීන්" සාමාන්‍ය තත්ත්වයට වඩා ඉහළින් සිටියේය. සෑම රාත්‍රියකම ඔහු විශාල ජනකායක් රඳවාගෙන හොඳ ජීවිතයක් ගත කළේය.

තරමක් තරුණවියේ දී ඔහු අබිං වලට ඇබ්බැහි විය. මෙය ඔහුගේ උගුරට බලපෑ නිසා කාලය ගෙවීයත්ම ඔහුට කථාන්දරකීම අත්හැර දැමීමට සිදු විය. ඉන්පසු ඔහු තමාගේ ජීවිතය ගෙනයාමට වෙළඳපොළවල් සහ රංග ශාලාවල සූදු කුඩාරාමක් පවත්වාගෙන ගියේය. රොසලින්ඩ් සහ මම මේ මිනිසා මුලින්ම මුණගැසෙන විට ඔහුට වයස අවුරුදු තිස් අටක් වූ අතර ශාරීරිකව සහ අධ්‍යාත්මිකව සම්පූර්ණයෙන්ම බිඳ වැටී තිබුණි. ඔහු කුදුව, සම සහ අස්ථි ඇට සැකිල්ලක් බවට පත්ව සිටියේය. එකල මම ඔහුගේ උපන්ගම වූ "හසින්සෙන්" හි දවස් දහයක් ගත කළෙමි. සෑම සවසකම වැන්ග් ෆූ-ලින් අබිං පානය සඳහා තානායමේ බටහිර කාමරයට යන ආකාරය මම දුටුවෙමි.

එක් සැන්දෑවක මම ඔහුට මෙසේ කීවෙමි. වැන්ග් ෆූ-ලින් මම ඔබ වෙනුවෙන් දැඩි වේදනාවට පත්ව සිටිනවා. මන්ද ඔබ තෝරාගත් මාර්ගය කෙලින්ම ගමන් කරන්නේ අපායටයි. ඔබ අපට කියනවා ඔබට මෙහි තිබෙන තෘෂ්ණාවට එරෙහි විය නොහැකි බව නමුත් අපායේ ඇති තෘෂ්ණාව මීට වඩා දස දහස් ගුණයකින් වැඩි විය හැකිය. එවිට ඔබට එය ලිහිල් කිරීමට අබිං අළු පවා ලබා ගැනීමට නොහැකි වනු ඇත. ඔහු බිදුණු හඬකින් මෙසේ පිළිතුරු ලබා දුන්නේය. ඔබ කියන දේ ඉතා සත්‍ය බව මම දනිමි. මම අළුත් ගිවිසුම කියවා මට අත්වන ඉරණම ගැන හොඳින් දනිමි. මේ දරුණු අබිං ග්‍රහණයෙන් මිදීමට මම බොහෝ උත්සාහ කළෙමි. මම දැන් බලාපොරොත්තු සුන්වී අතහැර දැමූවෙමි.

වැන්ග් ෆූ-ලින්, ඔයා ඔය විදිහට කථා කරන්න එපා කියා මම කීවෙමි. අපේ ගැලවුම්කරුවාණන් ගැන බලාපොරොත්තුවක් තියෙනවා. උන්වහන්සේට පුළුවන් උන්වහන්සේ තුළින් දෙවියන් වහන්සේ වෙතට එන සියල්ලන්වම සම්පූර්ණයෙන්ම ගලවාගන්න. එම නිසා චුවාන්ග් නගරයට ගොස් වෛද්‍ය මැල්කම්ව මුණගැහෙන්න ඔහුට ඔබ වෙනුවෙන් යමක් කළ හැකියි. මම කොහොමද එච්චර දුරක් පයින් යන්නේ කියා ඔහු ඇසුවේය. එය කිලෝමීටර් හතලිස් පහක් දුරින් ඇති අතර මට මගේ ජීවිතය බේරා ගැනීමට කිලෝමීටර් පහක්වත් ඇවිද ගැනීමට නොහැකියි. නමුත් ක්‍රමයක් තියෙනවා යැයි මම කිවෙමි. මට දිනපතා වැඩිවෙන උණක් හැදිලා පසුව එය "ටයිපොයිඩ්" ලෙස හඳුනාගත්තා. මම ඔවුන්ගෙන් කරත්තයක් ඉල්ලා සිටියා. ඔවුන් මට කරත්තයක් එවනවා ඒ කරත්තයෙන් ඔබටත් යන්න පුළුවන් කියා මම කියූවෙමි.

වැන්ග් ෆූ-ලින් දිගටම විරුද්ධ වී මෙසේ කීවේය. මම මුදල් එක්දහස් පන්සියයක් නොගෙවන්නේ නම් වෛද්‍යවරයා මාව රෝගියෙක් ලෙස

(චීනයේ මිෂනාරිවරයෙක් වූ ජොනතන් ගෝෆෝර්ත් විසිනි.) (1859-1936)

පිළිගන්නේ නැහැ. මගේ නමට මුදල් පහක්වත් නැහැ. මම නැවතත් ඔහුව අතහරින්නට අකමැතිව වැන්ග් ෆූ-ලින් වෙතට හැරී මෙසේ කීවෙමි. මුදල් ගැන ගණන් ගන්න එපා. මම වෛද්‍ය මැල්කම් සමඟ ඒ හැමදේම කරන්නම්, මාත් එක්ක එන්න කියා කියූවෙමි. ඔහු මා සමඟ පැමිණි අතර මම ඔහුව රෝහල වෙත රැගෙන ගියෙමි.

බන්ධනය කැඩී යයි

ඔබට ඔබේ කාර්යය කිරීමට සිදුවනු ඇත. බෙහෙත් වලින් කළ හැකි දේ ඉතා ස්වල්පයයි. ඔහුගේ දුක්ඛිත තත්ත්වය ගැන සිතීමෙන් වැලකී සිටින්නට හැකිතාක් උත්සාහ කරන්න කියා වෛද්‍යවරයා මට අනතුරු ඇඟවීය. ඔහුව දින කිහිපයකට වතාවක් අපේ නිවසට ගෙන්වාගෙන තේ සහ කේක් දී බටහිර රටවල පින්තූර පෙන්වමින් ඔහු සමඟ යාච්ඤා කළෙමු. ඔහු සමඟ සෑම මොහොතකම සිටීමට මනුෂ්‍යයෙකුව මම යොමු කළෙමි. පස්වෙනි දවසේදී ඔහු මන්දබුද්ධිකයෙක් වගේ තාප්පයෙන් පැන අබිං බීමට පාර දිගේ ගියේය. පෙණුන විදිහට ඔහු සියලු ආශාවන්ගෙන් මිදුණේය. අබිං පාවිච්චි කරන කෙනෙකුව යම් ස්ථානයක විශ්වාසනීයව තබා ගැනීම අසීරුය. සුභාරංචිය ප්‍රකාශ කිරීමේ දී අපේ පවුලට දැඩි ලෙස සහය අවශ්‍ය බව අපි දැන සිටියෙමු. ඒ නිසා පැහැදිලි මඟපෙන්වීමකින් තොරව වැන්ග් ෆූ-ලින්ව මුදා ගැනීමට නිර්භීත නොවී අපි

4 පිටුවට

3 පිටුවෙන්

කැඩුණු නමුත් පිරවූ භාජනයක්..

වසර දෙකකට ආසන්න කාලයක් ඔහුව තනි කළෙමු.

මහත් වූ අවශ්‍යතාවයක්

1895 ඔක්තෝබර් මාසයේ දී මම මගේ බිරිඳ සහ දරුවන්ව චැංටේ නගරය වෙත ගෙන ගියෙමි. විදේශීය කාන්තාවක් සහ දරුවන් මීට පෙර එම කලාපයේ මනුෂ්‍යයන් මිට පෙර දැක තිබුණේ නැත. තරුණ, මහළු, පිරිමි, ගැහැණු දහස් ගණන් දෙනා කුතුහලයෙන් එහි ඇදී ආවෝය. අපි උදේ ආහාරය ගන්නා ආකාරය කුතුහලයෙන් බලා සිටියෝය. හිරු බැස යන තෙක් අපේ ජනේල ළඟින් මනුෂ්‍යයන් ඉවත්ව ගියේ නැත. මනුෂ්‍යයන්ගේ මිත්‍රත්වය දිනා ගැනීමට සහ ඔවුන්ට සුභාරංචිය දීමට මෙම අපූරු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබාග න්නේ කෙසේදැයි මෙතෙක් පැවති ප්‍රශ්නයයි. මම පුරුෂයන්ව පිළිගෙන ආලින්දයේ දී දේශනා කළ අතර කාන්තාවන්ව සහ ළමයින්ව ගෙයි ඇතුළට ගෙන ගියෙමු. එහි මගේ බිරිඳ සහ දරුවන් සිටියෝය.

ඒ වෙලාවේ මට උදව් කරන්න ඉවැන්ජලිස්තවරයෙක්වත්, මගේ බිරිඳට උදව් කිරීමට බයිබලය දැන සිටි කාන්තාවක්වත් සිටියේ නැත. මෙම සෙනඟ අතරට පැමිණීමේ වෙහෙසට අමතරව නව සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ සහ ගොඩනැගීමේ අධිෂ්ඨානය මට තිබුණි. සමහර විට වැඩි වේලාවක් දේශනා කිරීමේ වෙහෙස දරාගත නොහැකි යැයි මට හැගෙන විට මගේ බිරිඳගෙන් සටහනක් ලැබුණි. එහි සටහන් වූයේ ඇගේ සහයට පැමිණ කාන්තාවන් සමඟ කථාකර ඇයව නිදහස් කරන ලෙසයි. මේ ස්වභාවය නිසා සති දෙකකදී අපි අසරණ තත්ත්වයකට පැමිණියෙමු. දවසක් මම මගේ බිරිඳ ළඟට ගිහින්, මගේ දෙවියන් වහන්සේ, ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ උන්වහන්සේගේ මහිමය උදෙසා අපේ සියළු අවශ්‍යතාවයන් සපුරාලනු ඇත. යන වචනය පෙන්වා අපි මෙය සැබවින්ම විශ්වාස කරනවාද? සුභාරංචිය දේශනා කිරීමට අපට උපකාර කිරීම සඳහා කෙනෙකු එවන ලෙස ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලා සිටිමු. පසුව මාගේ බිරිඳ පැවසුවේ අපට චැංටේ දිස්ත්‍රික්කයේ කිසිවෙක් ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරී නොතිබූ විටත් අපි එවැනි උපකාරයේ වර්ෂාවක් සඳහා පැහැදිලි අහසක් ඉල්ලා සිටි බවයි. නමුත් දෙවියන් වහන්සේ ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දුන් සේක. ඊළඟ දවසේ වැන්ග් ෆු-ලින් ඔහුගේ නිවසේ සිට අප වෙතට පැමිණීමට ආරම්භ කළේය.

අනපේක්ෂිත ඉවැන්ජලිස්තවරයෙක්

නමුත් ඔහු අපේ සේවයට ළඟාවන විට දෙවියන් වහන්සේ විසින් දෙන ලද සහයෙකු ලෙස පිළිගැනීමට තිබූ අදහස වෙනස් වූයේය. ඔහුගේ පෙනුම හරියටම වෘත්තීය යාචකයෙකුගේ පෙණුමයි. සපත්තු මේස් හරහා පෙනෙන ඇඟිළි ඉරුණු තොප්පිය සෑම තැනින්ම ඉරුණු ඇඟට තදවූ ඇඳුම සහිතව ඔහු සිටියේය. සැබවින්ම දෙවියන් වහන්සේ මනුෂ්‍යයා බලන ආකාරයෙන් නොබලන සේක. එම නිසා මම ඔහුව දැකීමෙන් බොහෝ සේ සතුටට පත්වූයෙමි. එකෙනෙහිම මම මෙසේ කීවෙමි. වැන්ග් ෆු-ලින් පැමිණීමේදී පෙනෙන්ට තිබූ ස්වභාවයෙන් මහත්වරුන්, නිල ලේකම්වරුන් සහ උගත්පන්තියේ අය ප්‍රේක්ෂකයන්ව සිටින ස්ථානයකට යොමු කිරීමට අවහිරයක් නොවූයේ, ඒ කාලයේදී මම චීන ඇඳුම් ඇඳගෙන සිටි නිසා මාගේ ඇඳුම් ඔහුට ඇන්දවීමට පහසු වූ බැවිනි. ඔහු සුභාරංචිය ප්‍රකාශ කරද්දී මට ඔහුව හොඳින් පෙණුනේය. කතන්දර කීමේ පැරණි හැකියාවේ සියළු බලය ඔහු වෙතට නැවත නැවත පැමිණෙන බව පෙනෙන්නට තිබුණි. ඔහුගේ දේශනාවේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ එයයි. තාර්කික අනුපිළිවෙලින් ඔහු සියලු විරුද්ධත්වයන් බිඳ වැටෙන තුරු එකින් එක කරුණු විග්‍රහ කළේය. ඔහු තම ප්‍රේක්ෂකයන් ඉදිරියේ බයිබල් චරිත ගැන කථා කරද්දි බයිබල් කථාන්දර විද්‍යාමානව බැබළුණෝය. අකීකරු පුත්‍රයා සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් කැපී පෙණුනේය. ඔහුම දුර රටක වාසය කර උෆරන්ගේ කෑම අනුභව කළ නිසා ඔහු කථාව හොඳින් දැන සිටියේය. පව්කාරයන්ගේ ප්‍රධානියා වූ තමන්ව දෙවියන් වහන්සේ ගලවාගත් බැවින් අනිත් සියල්ලන්ටම බලාපොරොත්තුවක් අති බව ඔහු සමීපයේ දී අසන්නන්ටද සහතික කරමින් බලය ප්‍රකාශ කළේය.

ඔහු අප සමඟ සේවයේ ආරම්භයේ සිටම නගරයේ සහ රට පුරා සෑම තැනකම ක්‍රිස්තුස් වහන්සේ වෙතට සෙනඟව ගෙනාවෝය. ඒ දවස්වලදී අපේ දේවස්ථානය නිතරම සෙනඟගෙන් පිරී ඉතිරී ගිය අතර කරුණාව මුදාගැනීම, තම ස්වාමියා සහ ගැලවුම්කරුවාණන් උසස් කිරීම පිළිබඳ කථාවන් පැවසීමෙන් ඔහු කිසිවිටෙකත් වෙහෙසට පත්ව එය නතර කළේ නැත. වසර තුනක් පුරාවට ස්වාමීන් වහන්සේ ඔහුට නොනැවතී වැඩි වන ශාරීරික දුර්වලතාවයන් සමඟ වුවද අධ්‍යාත්මික බලයෙන් දේශනා කිරීමට ඉඩ ලබා දුන් සේක. වැන්ග් ෆු-ලීන් ඔහුගේ කාලය කෙටි බව දැන සිටි අතර සෑම විටම කථා කළේ මිය යන මිනිසුන්ට මිය යන මිනිසෙකු ලෙසින්ය. දෙවියන් වහන්සේගේ අධික වූ කරුණාව ගැන සාක්ෂි දැරීමට ඉතිරි වූ වසර කිහිපය තුළ ඔහු ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඔහුගේ සියලු සබඳතා දිනා ගැනීමේ මාධ්‍යයක් විය. මුදවාගත් කථාන්දරකාරයා වන වැන්ග් ෆු-ලින් ඔහුගේ ශාරීරික ශක්තිය අසාර්ථක වන තෙක් කුරුසියේ කථාව ප්‍රකාශ කරමින් ජයග්‍රාහී ලෙස සදාකාලයටම වාසය කරන පිණිස තම මිදුම්කරුවාණන් සහ රජු හමුවට ගියේය.

අපගේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ ශුද්ධකමට පමුණුවන පිණිස යාච්ඤා කළ සේක

"සත්‍යතාවයෙන් ඔවුන් පවිත්‍ර කළ මැනව. ඔබගේ වචනය සත්‍යතාවය" (යොහාන් 17:17) විශ්වීය වශයෙන් ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව ලෙස හැඳින්විය හැකි යොහාන් 17 වන පරිච්ඡේදය ශුද්ධකමින්, ශුද්ධකමට යනුවෙන් හැඳින්විය හැකිය. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්, පියාණන් වහන්සේ සමඟ සමීපතම ප්‍රේමයෙන් කතා කරන එම රහස් ස්ථානයට අපව මෙහිදී පිළිගනු ලැබේ. මෙහිදී අපි යේසුස් වහන්සේගේ හදවත දෙස බලන්නෙමු. තම පියාණන් වහන්සේ ඉදිරියේ උන්වහන්සේ අප වෙනුවෙන් උන්වහන්සේගේ ආශාවන් සහ ඉල්ලීම් පිළිවෙලට තබන විට එහි ආනුභාවයෙන් ඇගේ (සභාවේ) මුහුණේ වැස්ම අයින් කරනු ලබන අතර සත්‍යය මුහුණට මුහුණ දකින්නෙමු. යාච්ඤාව මධ්‍යයේ කොතැනක හෝ අපි අධ්‍යයනය කරන බයිබල් පාඨය (යොහාන් 17:17) පිහිටා ඇත. එය එහි හදවතයි.

අපගේ ස්වාමීන් වහන්සේගේ සෙනඟගේ පවිත්‍රකම සඳහා වූ ආශාව මුළු යාච්ඤාව පුරාම පැතිරී ඇත. නමුත් එය එක්රැස් කර ප්‍රකාශකර, තීවුර කරනු ලබන්නේ ..., **"ඔබගේ සත්‍යතාවයෙන් ඔවුන්ව පවිත්‍රකළ මැනව, ඔබගේ වචනය සත්‍යතාවයයි."** යන එක වාක්‍යයකිනි. අපගේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මැදිහත්වීමේ ඉහළම ස්ථානයෙහි **"ඔවුන්ව පවිත්‍ර කළ මැනව"** යැයි මොරගසන විට පවිත්‍රකමේ ආශිර්වාදය කොයිතරම් අගනේද..? අපගේ ගැලවුම්කරුවාණන් උන්වන්වහන්සේගේ මරණයට පෙර දින රාත්‍රියේ දී උන්වහන්සේගේ පියාණන් වහන්සේ දෙසට දෑස් ඔසවා, "පියාණෙනි, ඔවුන්ව පවිත්‍ර කළ මැනව" කියා මොරගැසූ සේක. අප සිටින්නේ කොතැනකද එය ශුද්ධ වූ ස්ථානයකි. අපි කථා කරන කාරණය මොකක් වුවත් අපගේ සිතුවිලි ඉතා වැදගත්ව තිබීම ඕනෑකමින් ඉල්ලා සිටියි. ශුද්ධාත්මයාණනි වැඩිය මැනව. ශුද්ධකම උදෙසා මෙම යාච්ඤාවේ සම්පූර්ණ අර්ථය අපට ඉගැන්වුව මැනව. පළමුව මම ඔබේ අවධානයට යොමු කරන්නේ ගැලවුම්කරුවාණන් ඔවුන්ව පවිත්‍ර කරන්න යනුවෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද යන්නයි. දෙවනුව, උන්වහන්සේ එය ඉල්ලා සිටින්නේ කවුරුන් උදෙසා ද ... ? එය ඉල්ලා සිටින්නේ පියාණන් වහන්සේ, උන්වහන්සේට දෙනු ලැබූ අය උදෙසාය. තුන්වෙනුව, උන්වහන්සේ එය ඉල්ලා සිටින්නේ කාගෙන්ද .. ? යන වග අපි සටහන් කර ගනිමු. යේසුස් වහන්සේ, පියාණන් වහන්සේගෙන්ම මෙම පවිත්‍ර කිරීම ඉල්ලා සිටින සේක. මක්නිසාද උන්වහන්සේගේ සෙනඟව පවිත්‍ර කළ හැකි වන්නේ උන්වහන්සේටම පමණි. අවසාන වශයෙන් මෙම

(චාර්ල්ස් එච්: ස්පර්ජන් විසිනි.) (1834-1892)

ආශිර්වාදය සිදුවන්නේ කෙසේදැයි අපි **විමසා** බලමු. ඔබගේ සත්‍යතාවය තුලින් ඔවුන් පවිත්‍ර කළ මැනව, අපගේ ස්වාමීන් වහන්සේ පැහැදිලි කිරීමේ වාක්‍යයක් ලෙස ඔබගේ වචනය සත්‍යය යන්න එකතු කරන අතර එය ස්වාමීන් වහන්සේගේ වචනය කෙරෙහි අපගේ ඇදහිල්ලට සහ පසුතැවිලිවීමට උපදේශයක් විය.

පවිත්‍ර කරනු ලැබීම යනු කුමක්ද ?

එසේ නම්, ආරම්භයේ දී උන්වහන්සේ ඉල්ලා සිටි දේ සලකා බලන්න. අපගේ ගැලවුම්කරුවාණන් පියාණන් වහන්සේ වෙතින් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින මෙම ආශිර්වාදය කුමක්ද ..? උන්වහන්සේ මුලින්ම යාච්ඤා කරන්නේ ..., **"ඔබ ලෝකයෙන් ඔවුන් අහක් කරන පිණිස නොව, නපුරාගෙන් ඔවුන් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරමි. "** (යොහාන් 17:15) නපුරාගෙන් ආරක්ෂාවීමේ මෙම ආශිර්වාදය පමණක් ප්‍රමාණවත් නොවේ. උන්වහන්සේ ඔවුන් සඳහා ශුද්ධකම සොයයි. එබැවින් උන්වහන්සේ මොරගසමින්, "ඔවුන්ව පවිත්‍ර කළ මැනව ..". කියා ඉල්ලා සිටි

5 පිටුවට

4 පිටුවෙන්

අපගේ ස්වාමීන් වහන්සේ...

සේක. මෙම වචනය තුළ සැලකිය යුතු පරාසයක් ඇත. මට එහි සියලුම පරාසයන් ගැන අවධානය යොමු කිරීමට නොහැකි නමුත් කාරණා එකක් හෝ දෙකක් කෙරෙහි අවධානය යොමු කරන්නමේ.

කැපකර ගැනීම / වෙන්කර ගැනීම

එහි අර්ථය ඔබ වහන්සේගේ සේවය සඳහා ඔවුන්ව කැප කළ මැනව. එම වචනයේ තේරුම තවත් පැහැදිලි වන පිණිස පහතින් තිබෙන වචනත් කියවමු. "සත්‍යතාවෙන් ඔවුන්ද පවිත්‍ර වන පිණිස ඔවන් උදෙසා මා කැපකර ගතිමි." (යොහාන් 17:19) ස්වාමීන් වහන්සේගේ කාරනයේ දී එය පාපයෙන් පවිත්‍ර**වීම** අදහස් කළ නොහැකිය. මක්නිසාද අපගේ ගැලවුම්කරුවාණන් පවිත්‍ර නිසාත්, උන්වහන්සේගේ ස්වභාවය පාපයෙන් නොකැළැල්ව තිබූ නිසාත්, උන්වහන්සේගේ ක්‍රියාවන් නොකැළැල් නිසාත්, මනුෂ්‍යයා තුළ තිබූ නපුරු බැල්මක්වත් උන්වහන්සේ දැස්වල නොතිබූ නිසාත්ය. උන්වහන්සේ තුළ කිදු වරදක් සොයා ගැනීමට නොහැකි වූ අතර දෙවියන් වහන්සේ සෙවීමේ ප්‍රතිඵලය වූයේ දෙවියන් වහන්සේ, උන්වහන්සේ තුළ ඉතා සතුටුවන බව ප්‍රකාශ කිරීම පමණි. අපගේ ස්වාමීන් වහන්සේගේ පවිත්‍ර කිරීමේ අදහස වූයේ **දිව්‍යමය** අරමුණු ඉටුකිරීම සඳහා උන්වහන්සේට කැපකිරීම සහ පියාණන් වහන්සේගේ කැමැත්තට එකඟ කර ගැනීමයි. ***"වෙන්න, ඔබගේ කැමැත්ත කරන්ට මම ඇවිත් සිටිමියි. උන්වහන්සේ කී සේක..."***. (හෙබ්‍රෙව් 10:9) මේ අර්ථයෙන් අපගේ මැදහත්කරුවාණන් වන ස්වාමීන් වහන්සේ ඉල්ලා සිටින්නේ තම සියලු සෙනඟ පියාණන් වහන්සේ විසින් පූජකයන් කර ශුද්ධ සේවයට කැප කරන ලෙසයි. එබැවින් එම යාච්ඤාවෙන් අදහස් කරන්නේ පියාණෙනි.., ඔවුන්ව ඔබගේම ආත්මයට කැප කරන්න.

ඔවුන් ඔබගේ වාසය සඳහා සුදුසු මාළිගාවක් වේවා ...,! ඔබගේ පාවිච්චිය සඳහා සුදුසු උපකරණ වේවා .!. යනුයි.

අපි මේ ලෝකයට අයත් අය නොවේ. අපි මේ ලෝකයට අයිතිවන්නේ නම් යම් අභිලාෂයන් ඉටු කිරීමට ආශා වන්නෙමු. අපි සාතන්ට අයිති නොවෙමු. අපි තණ්හාවෙන් නොසිටින්නෙමු. අපි අපගේම නොවෙමු. එසේ වන්නේ නම්, අපි ආත්මාර්ථකාමීවිය හැකිය. අපව මිලදී ගනු ලබන අතර මිළ ගෙවනු ලබන්නේ උන්වහන්සේය. අපි යේසුස් වහන්සේට අයිතිවන අතර උන්වහන්සේ අපව පියාණන් වහන්සේ වෙතට යොමු කර අපව පිළිගන්නා ලෙසත්, උන්වහන්සේගේ අරමුණ සඳහා අපව විශුද්ධ කරන ලෙසත් අයැද සිටින සේක. මෙම කැපවීමට අපි හදවතින්ම එකඟ නොවන්නේද ..? පියාණෙනි, ඔබගේ සේවයට අපව විශුද්ධ කළ මැනව කියා අපි මොරගසන්නේ නැද්ද ..? අපව මුදාගත් ආකාරය අප විසින් අවබෝධ කරගෙන තිබෙනවා නම් අපි එසේ මොරගසන බව මම විශ්වාස කරන්නෙමි.

අපි මංමුලා වූ බැටළුවන් මෙන් සිටියෙමු. නමුත් දැන් අපි ශ්‍රේෂ්ඨ එඩේරාණන් සහ අපගේ ආත්මයේ එඩේරා වෙතට ආපසු හැරී ඇවිත් සිටින්නෙමු. මෙතැන් සිට අපි උන්වහන්සේගේ සෙනඟ සහ උන්වහන්සේගේ ගොදුරු බිමේ බැටළුවන් වන්නෙමු. ඔබ අයිති කාටදැයි යම් කෙනෙක් ඇසූ විට මම ක්‍රිස්තුස් වහන්සේට අයිති වෙමි කියා අපි උත්තර දෙන්නෙමු. ඔබගේ රැකියාව කුමක්දැයි යම් කෙනෙක් ඇසූ විට යෝනා මෙන් "මම දෙවියන් වහන්සේට බය වන්නෙමි." කියා පිළිතුරු දෙන්නෙමු. පහත් වස්තූන්, කුලී හේවා අරමුණු, ආත්මාර්ථකාමී අභිලාෂයන් සඳහා අපට අපව කුලියට ගත නොහැකිය. මක්නිසාද අප අපගේ ස්වාමීන් වහන්සේගේ සේවය සඳහා ගිවිසුම තුළ බැඳුරුම් ලෙස නිරතවන්නෙමු. අපි අපගේ අත ස්වාමීන් වහන්සේ වෙතට ඔසවමු. එය අපට නැවත ඇදගත නොහැකිය. අපි අපිට ප්‍රියමනාප දේවලින් ඉවත්වීමට කැමැත්තෙන් ගිවිසුම තුළ රැඳී සිටින්නෙමු. අපි පව් කිරීමට හෝ තමන් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිම නිදහසක් සොයන්නේ නැත. ඒ වෙනුවට මොරගසමින් පූජාව පූජාසනයේ අං දක්වා ලණු වලින් බැඳ තබන්නෙමු. අපව විශුද්ධ කරන්න කියා අයදින්නෙමු. අපි ඔබවහන්සේගේ බව මුළු ලෝකයාටම දැන ගැනීමට ඉඩ දෙන්නෙමු. මක්නිසාද අපි ක්‍රිස්තුස් වහන්සේට අයිති වන්නෙමු.

දෙවියන් වහන්සේට වෙන්කර ගැනීම

මීට අමතර දෙවියන් වහන්සේට අයිති අය අන් අයගෙන් වෙන්ව උන්වහන්සේගේ සේවයට කැපවී සිටියෝය. එහිදී පූජකයන්මෙන් විශේෂ සේවාවක් සඳහා වෙන්කර ගැනීම සිදු විය. මණ්ඩපයේ (සම්මුඛවීමේ කුඩාරමේ) දිව්‍ය සේවයේ දී ස්ථානය සහ භාජන විශුද්ධ කළ බවට ඔබට මතක ඇති. දේවමාළිගාව වෙන්කර ඇත්තේ දිව්‍ය සේවයේ කොපමණ භක්තියකින්ද ..? සබත් දවස අනිත් දවස්වලින් වෙන් කර ඇත. ඒ ආකාරයෙන්ම ස්වාමීන් වහන්සේට කැපවූ අයව සෙසු මනුෂ්‍යයන්ගෙන් වෙන්කර ඇත. ***"එබැවින් නුඹලා ඔවුන් අතරෙන් පිටතට ඇවිත් වෙන්ව සිටපල්ලා. අපවිත්‍ර දෙයකට අත නොගසා සිටපල්ලා යයි ස්වාමීන් වහන්සේ කියන සේක. එවිට මම නුඹලා පිළිගෙන, නුඹළාට පියෙක් වන්නෙමි. නුඹලා ද මට පුත්‍රයොත්, දුවරුත් වන්නහුයයි සර්ව පරාක්‍රමවූ දෙවියන් වහන්සේ කියන සේක."*** (2 කොරින්ති 6:17-18) ක්‍රිස්තුස් වහන්සේගේ සභාව නිර්මල කන්‍යාවියක් **විය** යුතු අතර ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් **සම්පූර්ණයෙන්ම** වෙන්කර ඇත. උන්වහන්සේගේ සෙනඟ සම්බන්ධයෙන් උන්වහන්සේගේම වචන මේවාය. ***"මම ඔවුන්ට ඔබගේ වචනය දුනිමි. මා ලෝකයාට අයිති නැති ලෙසම ඔවුනුත් ලෝකයාට අයිති නැති නිසා ලේකයා ඔවුන්ට වෛර වුණේය."*** (යොහාන් 17:14)

මේ අර්ථයෙන් විශුද්ධ අය නොඇදහිලිවන්තයන් සමඟ අසාමාන්‍ය ලෙස සම්බන්ධවීම නතර කර ඇත. ඔවුන් මේ වර්තමාන නපුරු ලෝකයට සමාන නොවේ. නමුත් ඔවුන් පෘතුවියේ ආගන්තුකයන් සහ වන්දනාකරුවන්ය. මෙය ඔවුන් සම්බන්ධයෙන් වඩා විශ්වාසදායක වන තරමට වඩා හොඳය. මෙම ඇදහිල්ල අත්හැරිය දවස්වල සභාවට ඇගේ මාර්ගය ඉගෙන ගැනීමට, ඇගේ උපරිමය අනුගමනය කිරීමට සහ ඇගේ සංස්කෘතිය ලබා ගැනීමට ලෝකය වෙතට යාමට වඩා හොඳ දෙයක් නැතැයි කියන සමහරු සිටිති. ඇත්ත වශයෙන්ම ලෝකය දිනාගත යුත්තේ අපි ලෝකයේ කාරණාවලට ගොදුරු නොවී සිටීමෙන්ය. ආලෝකය අන්ධකාරයට මෙන් ශුද්ධ ලියවිල්ල ලෝකයට පටහැනිය. දෙවියන් වහන්සේට බයවන තැනැත්තා සහ උන්වහන්සේට බිය නොවන තැනැත්තා අතර වෙනස පෙන්වන රේඛාව වඩා පැහැදිලිව තිබේ. එය හිරු එළිය නොමැති වූ **විට** එම දවස අඳුරු දවසක් බවට පත්වේ. ලුණුවල රස නැති වූ **විට** නරක්වීම සටන් වදින්නෝය. පළිගැනීම සමඟ ලෝකය ක්‍රමක්‍රමයෙන් **විනාශයට** යන්නෝය.

මෙම වචනය සභාවට තවමත් **තිබේ. *"අපි දෙවියන් වහන්සේගෙන් වන බවද, ලුළු ලෝකයා නපුරා තුළ බවද, දනිමුව.*** "(1 යොහාන් 5:19) " ***නුඹලා ලෝකයට අයිති නම් ලෝකයා තමුන්ගේම අයට ආදරේ වන්නෝය. නුවුත් නුඹලා ලෝකයාගෙන් නොවන නිසාත්, මා විසින් ලෝකයෙන් නුඹලා තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට වෛර වෙති."*** (යොහාන් 15:19) සභාව ලෝකයේ මිත්‍රත්වය **වර්ධනය** කර ගැනීමට උත්සාහ කරන්නේ නම් ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපේස්තුළු යාකොබ්ගෙන් මෙම පණිවිඩය ලබා දී ඇත. "කාමමිත්‍යාචාරික තැනැත්තියෙනි, ලෝකය සමඟ මිත්‍රකම දෙවියන් වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද ... ? එබැවින් කවරෙක් නමුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේ නම් ඔහු දෙවියන් වහන්සේට සතුරෙක් වන්නේය. (යාකොබ් 4:4) ලෝකය සතුටු කරන සියල්ලන්ට, ආත්මික අනාචාරයේ යෙදෙමින් අන්ධකාරයේ සිටින අයට උන්වහන්සේ විනිශ්චය පිළිබඳව අනතුරු අඟවන සේක. ලෝකයෙන් වෙන් සිටීම අප වෙනුවෙන් ක්‍රිස්තුස් වහන්සේගේ යාච්ඤාවයි.

දෙවියන් වහන්සේට කැපවීම සහ උන්වහන්සේ වෙනුවෙන් වෙන්ව සිටීම යන මේ කරුණු දෙක එකට එකතු කරන්න. එවිට ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ මෙම යාච්ඤාවේ අර්ථයට ළංවෙමින් සිටියි.

දෙවියන් වහන්සේගේ සෙනඟව ශුද්ධකමට පැමිණවීම

ඒ අතරම මෙම **විශු**ද්ධකරණය යන වචනයෙන් අදහස් වන්නේ එය සාමාන්‍යයෙන් තේරුම් ගන්නා දෙයයි. එනම් දෙවියන් වහන්සේගේ සෙනඟ ශුද්ධකමට පැමිණවීමයි. ඔවුන් තුළ නිර්මල හා ශුද්ධ වූ චරිතයක් ඇතිව ක්‍රියා කිරීමට ස්වාමීනී ඔබගේ සෙනඟව පවිත්‍ර කළ මැනව. යනු අපගේ දිනපතා යාච්ඤාව විය යුතුය. මෙහි ග්‍රීක් භාෂාවෙන් "විශුද්ධ කිරීම" යන වචනය සඳහා භාවිතා කර ඇති වචනයට පරිවර්තනයක් ලබා දී නැති බව ඔබගේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි. නමුත් එයට වෙනත් අර්ථයක් ඇත. එහි තේරුම පවිත්‍ර කිරීම නම් එය අපගේ ස්වාමීන් වහන්සේ ගැන ඊළඟ පදයේ ඇති පරිදි භාවිතා නොකරනු ඇත.

ඒ තුළ ඊට වඩා උසස් අර්ථයක් ඇත. සහෝදරයෙනි, ඔබව කිතුණුවෙක් ලෙස හඳුන්වනු ලැබුවොත් ඔබ මනුෂ්‍යය වර්ගයාගේ සාමාන්‍ය වැරදි වලින් පවිත්‍ර වී ඇති බවට සැකයක් තිබිය යුතු නැත. එසේ සැකකරන්නේ නම්, ඔබ දෙවියන් වහන්සේට පැහැදිලිවම බොරුකරන්නෙක් සහ ඔබේම ආත්මය රවටාගන්නෙක් වේ. එබඳු අය සදාචාර සම්පන්න නැති, අවංක නැති, කරුණාවන්ත නොවන, සත්‍යවාදී නොවන, දේවරාජ්‍යයෙන් දුරස්ව සිටින අය වෙති. විනීත මනුෂ්‍යයන්ගේ පවා දරුවන් නොවන ඔවුන් දෙවියන් වහන්සේගේ දරුවන් වන්නේ කෙසේද.. ? දන්නා වූ

6 පිටුවට

5 පිටුවෙන්

අපගේ ස්වාමීන් වහන්සේ...

ඕනෑම පාපයක් තුළ හිතාමතාම රැඳී සිටින සහ එයින් සතුටක් ලබන මනුෂ්‍යයාගේ ආත්මය තුළ දෙවියන් වහන්සේට වාසය කළ නොහැකිය.

කිතුණුවන් තෘෂ්ණාව, බොරුව යන අපිරිසිදු දූෂණයෙන් මිදී ඇත. එය ඔබ සම්බන්ධයෙන්ද සත්‍යය බව අපි පිළිගනිමු. ඔබ එසේ නොවේ නම් දෙවියන් වහන්සේ ඉදිරියේ යටත් වෙන්න පසුතැවිලිවෙන්න. මන්ද ඔබට කරුණාවේ ආරම්භය අවශ්‍ය වේ. **"තවද ක්‍රිස්තුස් වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමඟ කුරුසියෙහි ඇණගැසුවෝය."** (ගලාති 5:24) නමුත් විශුද්ධිකරණය යනු හුදු සදාචාරයට සහ ගෞරවාන්විතභාවයට වඩා වැඩි දෙයකි. එය මනුෂ්‍යයාගේ පොදු පාපවලින් **මිදීම** පමණක් නොව ස්වභාවධර්මයේ දැඩි බවින්, මළ බවින් සහ මාංශයේ ස්වභාවයෙන් මිදීමයි. එය මාංශයේ කාරණා වලින්මිදීමයි. ඉතා හොඳම අධ්‍යාත්මික හා දිව්‍යමය දේවලට පිළිගැනීමයි.

ලෞකික දේ ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මික රාජ්‍යයේ පැවැත්ම සමඟ සම්බන්ධ වන්නේ නැත. අපට අවශ්‍යවන්නේ ස්වභාවික දෙයට වඩා ආත්මික දේ ඉහළ නැංවීමයි. අපේ යාච්ඤාව මෙලෙස විය යුතුය. "ස්වාමීනි.., අපව ආත්මික කරන්න. අපව උසස් කරන්න. දෙවියන් වහන්සේ සමඟ සහයෝගීව වාසය කිරීමට අපට සලස්වන්න. මාංශයට හා රුධිරයට හෙළි කළ නොහැකි හෝ හඳුනාගත නොහැකි උන්වහන්සේව දැන ගැනීමට අපට සලස්වන්න. ජීවමාන දෙවියන් වහන්සේගේ ආත්මයට අප කෙරෙහි පූර්ණ පරමාධිපත්‍ය ඇති අතර දෙවියන් වහන්සේගේ කැමැත්ත අප තුළ සම්පූර්ණ කරයි. මෙසේ කරනු ලබන්නේ විශුද්ධ කරනු ලැබීම සඳහාය.

විශුද්ධ කිරීම යනු පවිත්‍ර කිරීමටත් වඩා උසස් වචනයකි. මන්ද එයට එම වචනය සහ තවත් බොහෝ දේ ඇතුළත්ව තිබේ. අපවිත්‍ර දේවලින් පිරිසිදුවීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපි සියලු ගුණාංග වලින් සැරසී සිටිය යුතුය. ඔබගේ ධර්මිෂ්ඨකම, සදාචාර සම්පන්නකම ලියන්නන්ගේ සහ එරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකම ඉක්මවා නොයන්නේද ..? ඔබ දසයෙන් කොටස දෙමින් , දිළිඳුන්ට දන්දෙමින්, ඔබේ ආගමික පිළිවෙත් රක්ෂා කරනවා නම් වැරදි යැයි ඔබ සලකන අනිත් අයට වඩා ඔබ කරන්නේ කුමක්ද ..?

දෙවියන් වහන්සේගේ දරුවන් දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රදර්ශනය කළ යුතුය. ඔවුන් උන්වහන්සේගේ මහිමය සඳහා උද්යෝගයෙන් පිරී සිටිය යුතුය. ඔවුන් ත්‍යාගශීලී, පරාර්ථකාමී ජීවිත ගත කළ යුතුය. ඔවුන් දෙවියන් වහන්සේ සමඟ ගමන් කළ යුතුය. මහෝත්තමයාණන් වහන්සේ සමඟ අදහස් හුවමාරු කරගත යුතුය. අපගේ අරමුණ නව උත්පාදය නොලැබූ අයට වඩා බොහෝ උසස් අරමුණක් විය යුතුය. මනුෂ්‍යය වර්ගයා නොදන්නා ජීවිතයකට සහ රාජධානියකට අපි ළඟා විය යුතුය. දැන් යාච්ඤාවේ මෙම ආත්මික හැඟීම බොහෝ විට අමතකවේ යයි මම බිය වෙමි. දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේම අප තුළ අත්දැකීමෙන් එය දැන ගැනීමට සලස්වන සේක්වා... අපගේ මනුෂ්‍යයත්වයේ හැඟීම් තුළ ස්වාමීන් වහන්සේගේ ශුද්ධකම ලියවේවා.

ප්‍රේමවන්තයෙනි, අපගේ ස්වාමීන් වහන්සේගේ මෙම යාච්ඤාව ඉතා වැදගත් අවශ්‍යතාවයක් වන්නේ මක්නිසාද ..? විශුද්ධකරණයෙන් තොරව අප ගැලවෙන්නේ කෙසේද ..? **"සියල්ලන් සමඟ සමාදානයෙන් සිටින්නටත් ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන් වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුව යන්නත් උත්සාහ කරපල්ලා"** (හෙබ්‍රෙව් 12:14) පාපය තවමත් අපව පාලනය කරයි නම් පාපයෙන් ගැලවිය හැකිවන්නේ කෙසේද ...? අපි ජීවත් වන්නේ ශුද්ධ දේවභක්තික, ආත්මික ජීවිත නොවේ නම්, අපි නපුරේ බලයෙන් මිදුණු බව කියන්නේ කෙසේද ..? විශුද්ධකරණයෙන් තොරව අපි සේවයට නුසුදුසුවනු ඇත. පියාණන් වහන්සේ, යේසුස් වහන්සේව ලෝකයට එවුවාක් මෙන් අප සැමදෙනාවම ලෝකයට යැවීමට අපගේ ස්වාමීන් වහන්සේ කැමති වන නමුත් පාපිෂ්ඨ මනුෂ්‍යයාට උන්වහන්සේ සේවයක් ලබාදෙන්නේ කෙසේද ? ස්වාමීන් වහන්සේගේ භාජන පිරිසිදු විය යුතු නොවේද ..?

විශුද්ධකරණය නොමැතිව අපට ශුද්ධ ලියවිල්ලේ අභ්‍යන්තර රසවත් බව අත්දැකිය නොහැකිය. අපවිත්‍රව සිටින අය බයෙන්, සැකයෙන් සිටින අතර ඔවුන් බොහෝ විට පවසන්නේ ආගමික ක්‍රියාවල භාහිර ක්‍රියාවන් කොපමණ වෙහෙසකර කාරණාද කියාය. එය පුදුමයක් නොවේ. ඔවුන් අභ්‍යන්තර ප්‍රීතිය නොදන්නා නිසා කිසි දිනෙක දෙවියන් වහන්සේගේ ප්‍රීතිය තුළ ප්‍රීතිවීමට ඉගෙන ගෙන නැත. ඔවුන් ආලෝකය තුළ ගමන් නොකරන්නේ නම් ස්වාමීන් වහන්සේගේ මුහුණේ සැබෑ දේවභක්තිය ඇති ස්වර්ගය දැනගන්නේ කෙසේද ..? එම නිසා එම යාච්ඤාව මා වෙනුවෙන් ඔබ වෙනුවෙන් සහ දෙවියන් වහන්සේගේ **මුළු** සභාව වෙනුවෙන් කළ යුතු යාච්ඤාවකි. **"පියාණෙනි, සත්‍යතායෙන් ඔවුන් පවිත්‍ර කළ (විශුද්ධ කළ) මැනව"**

උන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් යාච්ඤාවක්

දැන් මට ඔබගේ අවධානය යොමු කිරීමට අවශ්‍ය වන්නේ දෙවන කාරණය වෙතටයි. එනම් මෙම යාච්ඤාව කරනු ලැබුවේ කවුරුන් වෙනුවෙන්ද කියාය. එය භාහිර ලෝකයට ඉදිරිපත් කළේ නැත. පාපය තුළ **වියගොස්** සිටි අයට එය සුදුසු යාච්ඤාවක් නොවේ. අපගේ ස්වාමීන් වහන්සේ දැනටමත් ගැලවීම ලබා ඇති ස්ත්‍රී පුරුෂයන්ගෙන් සැදුම්ලත් සමාගම ගැන සඳහන් කර ඇති අතර ඔවුන් දෙවියන් වහන්සේගේ වචනයේ තබාගත් බව පැවසූ සේක. ඔවුන් උන්වහන්සේගේ විය. **"ඔබ ලෝකයෙන් මට දුන් මනුෂ්‍යයන්ට ඔබගේ නාමය ප්‍රකාශ කළෙමි. ඔවුහු ඔබ සන්තක වූවෝය. ඔබ ඔවුන් මට දුන් සේක. ඔවුහු ඔබගේ වචනය රක්ෂා කළෝය."** (යොහාන් 17:6) යේසුස් වහන්සේ **විශු**ද්ධ කරන ලෙස තවමත් පියාණන් වහන්සේට යාච්ඤා කරන්නේ ඔබ වෙනුවෙන් වනසේක.

අපගේ ස්වාමීන් වහන්සේ යාච්ඤා කළ මෙම ඇදහිලිවන්තයන් ඔවුන්ගේම සහ ඊළඟ ගැලවීම ලැබූ පරම්පරාවල ගුරුවරුන් සහ දේශයකයන් වූ බව ඔබ දැකීම මට වඩාත් අවශ්‍යය විය. ඔවුන් බීජ ස්වල්පයක් වූ අතර එයින් අනාගතයේදී සභාව වර්ධනය වනු ඇත. ඔවුන්ගේ අස්වැන්න මුලූ භූමිය සතුටු කරනු ඇත. ඔවුන්ව ක්‍රිස්තුස් වහන්සේගේ මිෂනාරි සේවය සඳහා පිටත්කර හැරීමට ඔවුන්ව විශුද්ධ කළ යුතු විය. ශුද්ධ වූ දේවියන් වහන්සේ අශුද්ධ වූ පණිවිඩකාරුවන්ව යවන්නේ කෙසේද ..? නීත්‍යානුකූල නොවන දේව සේවකයා දෙවියන් වහන්සේ නොයැවූ කෙනෙකි. අශුද්ධ වූ මිෂනාරිවරයෙක් ඔහු පැමිණෙන සෙනඟ අතර හානිදායක පුද්ගලයෙක් බවට පත්වේ. පාසලක අශුද්ධ ගුරුවරයෙක් යනු ඔහු පවත්වන පන්තියට ආශිර්වාදයක්වීමට වඩා තුවාලයකි. අන් අයව ගැලවුම්කරුවාණන්ගේ පාමුලට ගෙන ඒම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය මත රැඳී සිටීමටත්, ඔබ සමග වැඩ කිරීමත් ඔබට බලාපොරොත්තු විය හැකි වන්නේ දෙවියන් වහන්සේට විශුද්ධ වූ ප්‍රමාණයට සමානුපාතිකව පමණි.

දෙවියන් වහන්සේ තම රාජ්‍යයේ ව්‍යාප්තිය සඳහා යොදා ගැනීමට මනුෂ්‍යයෙකුගේ යෝග්‍යතාවය සඳහා ශුද්ධකම අත්‍යාවශ්‍යය සුදුසුකමකි. එම නිසා අපගේ ස්වාමීන් වහන්සේ ප්‍රේරිතයන් සහ අනෙකුත් සේවකයන් වෙනුවෙන් **"ශුද්ධ වූ පියාණෙනි ඔවුන් විශුද්ධ කළ මැනව"** කියා යාච්ඤා කළ සේක.

තවද අපගේ ස්වාමීන් වහන්සේ ඔවුන් සියල්ලෝම ඒකත්වයක් වන පිණිස යාච්ඤා කළ සේක. (යොහාන් 17:21) මෙම ප්‍රියජනක ප්‍රතිඵලය සඳහා ශුද්ධකම අවශ්‍යවේ. අපි ඒකත්වයක් නොවන්නේ ඇයි ..? පාපය මහත් ලෙස බෙදීමේ අංගයකි. පරිපූර්ණ ශුද්ධවන්තයන් පරිපූර්ණ ලෙස එක්සත් වනු ඇත. ශුද්ධවන්ත මනුෂ්‍යයන් වැඩිවන තරමට ඔවුන් තම ස්වාමියාට සහ එකිනෙකාට ප්‍රේමකරන අතර එමගින් ඔවුන් එකිනෙකා සමඟ සමීප සම්බන්ධතාවයකට පැමිණේ. අපගේ පව් සහ අපගේ වැරදි තිත්තකමේ මුල් වන අතර ඒවා පැණනැගී අපට කරදර කරයි. බොහෝ දෙනෙක් අපවිත්‍ර වෙති. අපගේ දුර්වලතා උත්සන්නවී අපගේ චරිතයේ සම්පූර්ණකම් සහ අපගේ දෙවියන් වහන්සේගෙන් දුරස්ථව ගමන් කිරීම නිසා භේද සහ අසමගිය ඇතිවේ. නිකායන්වලට බෙදීම සහ මිත්‍යාදෘෂ්ඨීන් වර්ධනය වී සීතල සහ ඇල්මැරුණු බව ඇති කරයි. අපි සියල්ලන්ම ක්‍රිස්තුස් වහන්සේ තුළ පූර්ණ ලෙස රැඳී සිටින්නේ නම් අපි එකිනෙකා සමඟ සහ දෙවියන් වහන්සේ සමඟ එක්සිත්ව සිටින අතර උන්වහන්සේගේ සභාවේ එකමුතුකම සඳහා අපගේ ස්වාමීන් වහන්සේගේ මහත් යාච්ඤාව ඉටුවනු ඇත.

එපමණක් නොව අපගේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මහිමය දකින පිණිස උන්වහන්සේ සමඟ උන්වහන්සේ සිටින තැන උන්වහන්සේ සමඟ, සිටින පිණිස කරන ලද ඉල්ලීම මගින්ද උන්වහන්සේගේ සවිස්තරාත්මක යාච්ඤාව අවසන් කරනු ලැබූ සේක. මේ සඳහා සම්පූර්ණ විශුද්ධකරණය අත්‍යාවශ්‍යවේ. පවිත්‍ර නොවූ අය ක්‍රිස්තුස් වහන්සේ සමඟ ස්වර්ගයේ වාසය කරයිද ? අපවිත්‍ර ඇස් උන්වහන්සේගේ තේජස දකියිද ..? එය විය නොහැකිය. අපි උන්වහන්සේගේ ශරීරයේ සාමාජිකයන් නොවන්නේ නම් උත්කෘෂ්ඨ වූ හිසෙහි තේජස හා ජයග්‍රහණවලට සහභාගි විය හැකි වන්නේ කෙසේද ..? ශුද්ධ වූ හිසකට අපිරිසිදු සහ වංක සාමාජිකයන් සිටිය හැක්කේ කෙසේද ...? සහෝදරවරුනි, අපි ශුද්ධව සිටිය යුතුය. මක්නිසාද ක්‍රිස්තුස්

7 පිටුවට

"... ඒ තැනැත්තවහන්සේ දෙවියන් වහන්සේගෙන් අපට ප්‍රඥාව එනම්, ධර්මිෂ්ඨකම ද, ශුද්ධකමද, මිදීමද කරනු ලැබූ සේක. , (1 කොරින්ති 1:30)

6 පිටුවෙන්

අපගේ ස්වාමීන් වහන්සේ...

වහන්සේ ශුද්ධව සිටින සේක. ක්‍රිස්තියානි ජීවිතයේ අරමුණු සඳහා මේ ලෝකයේ හෝ සදාකාලයටම අවංකව ගමන් කිරීමට හදවතේ පවිත්‍ර බව නියත වශයෙන්ම අවශ්‍යය. පාපයේ ජීවත්වන අය පාපයේ සේවකයෝ වෙති. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් සත්‍යයට, ශුද්ධකමට, ප්‍රේමයට අළුත්කරනු ලැබූවන්ට එපමණක් ශුද්ධ වූ ජීවිතයේ ප්‍රීතිය සහ ස්වර්ගීය ප්‍රීතියේ කොටස්කරුවන්වීමට බලාපොරොත්තු **විය** හැකිය.

අපගේ ශුද්ධ වූ පියාණන් වහන්සේගේ කාර්යය

අප සලකා බලන්නා වූ තුන්වන කාරණය ගැන ටිකක් අවධානය දිය යුතුය. එනම් මෙම යාච්ඤාව යොමු කරන්නේ කාටද යන්නයි. **"ඔබගේ සත්‍යතාවය තුළින් ඔවුන්ව පවිත්‍ර (විශුද්ධ) කළ මැනව"** ආත්මවල ශ්‍රේෂ්ඨ පියාණන් වන සර්වබලධාරී දෙවියන් වහන්සේට මිස වෙන කිසිවෙකුට ආත්මයක් විශුද්ධ කළ නොහැකිය. උන්වහන්සේ අපවද ශුද්ධ කළ යුතුය. නැතහොත් අපි කිසිවිටෙකත් ශුද්ධකමේ චරිතය ලබා නොගන්නෙමු. අපගේ දයාබර ගැලවුම්කරුවාණන් මෙ යාච්ඤාවේදී සර්වබලධාරී දෙවියන් වහන්සේට ශුද්ධ වූ පියාණෙනි..., කියා ආමන්ත්‍රණය කරන සේක. ශුද්ධවන්තභාවය ඇති කිරීම දෙවියන් වහන්සේගේ කාර්යය වන අතර ශුද්ධ වූ පියෙකුට ශුද්ධ වූ දරුවන්ගේ පමණක් පියා විය හැකිය. මන්ද උන්වහන්සේ තුළ උපදින්නා වූ අය උන්වහන්සේ මෙන් වන්නෝය.

යේසුස් වහන්සේව විශ්වාස කරන ඔබට උන්වහන්සේගේ පුත්‍රයන්වීමට උන්වන්සේ බලය ලබාදෙන අතර එම බලයේ කොටසක් ඇත්තේ ස්වර්ගයේ සිටින අපගේ පියාණන් වහන්සේගේ ස්වභාවය සහ චරිතය අනුව ශුද්ධවීම කුළය. අප ශුද්ධව සිටින්නාක් මෙන් බොහෝ සහෝදරයන් අතරේ කුළුදුල වන පිණිස දෙව මිනිසා ලෙස ස්වර්ගයේ සිට පැමිණි ස්වාමීන්ගේ රූපය අප දරා සිටින්නෙමු. දෙවියන් වහන්සේගේ ස්වභාවයම ශුද්ධකම සඳහා අපගේ යාච්ඤාවලදී අපව දීරිමත් කළ යුතුය. මන්ද උන්වහන්සේගේ සම්පූර්ණ කැමැත්ට අනුව අප තුළ ක්‍රියාත්මකවීමට උන්වහන්සේ ප්‍රමාද නොවන සේක.

ප්‍රේමවන්තයෙනි, මෙම විශුද්ධකරණය එහි මුල් අවදියේ සිටම දෙවියන් වහන්සේගේ ක්‍රියාවකි. අපි මංමුලාවී සිටින්නෙමු. එම නිසා අපට උන්වහන්සේගේ දිව්‍යමය පෙළඹවීම නොමැතිව මහත් වූ එඩේරාවන උන්වහන්සේ වෙතට හැරී ඒමට නොහැකිය. විශුද්ධකරණය ආරම්භ වන නැවත උත්පාදනය සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේගේ ආත්මයේ ක්‍රියාවකි. ශුද්ධකම පිළිබඳ සෑම සිතුවිල්ලක්ම සහ පාරිශුද්ධභාවයෙන් පසුව ඇති සෑම ආශාවක්ම ස්වාමීන් වහන්සේගෙන් පැමිණිය යුතුය. මක්නිසාද අපි ස්වභාවයෙන්ම අධර්මිෂ්ඨකමට බැඳී සිටින්නෙමු

එමෙන්ම අප තුළ ඇති පාපයෙන් සම්පූර්ණ ලෙස ජයග්‍රහණය ලබා ගැනීමත් අපගේ ස්වාමීන් වහන්සේගේ කැමැත්ත පරිපූර්ණ ලෙස ඉටුකිරීමත් යන මේ විශාල කාර්යය අප විසින්ම කරගෙන යාමට අපට බලයක් නොමැති බැවින් සියල්ල අලුත් කිරීම දෙවියන් වහන්සේගේ කාර්යය වන සේක විශුද්ධිකරණය යනු අහස පොළොව සෑදීම තරම්ම දෙවියන් වහන්සේගේ කාර්යයකි. මේ සඳහා පෑහෙන්නේ කවුද ? සැබෑ විශුද්ධිකරණය මුළුමනින්නම මුල සිට අග දක්වාම එම තෝරාගත් අයව විශුද්ධිකිරීම සඳහා පියාණන් වහන්සේ විසින් එවා ඇති ආශර්වාදලත් දෙවියන් වහන්සේගේ ආත්මයේ ක්‍රියාවකි. එබැවින් විශුද්ධිකරණය යනු මොනතරම් බලවත් ක්‍රියාවක් දැයි බලන්න. එමෙන්ම අපගේ ස්වාමීන් වහන්සේ ... ඔබගේ සත්‍යතාවයෙන් ඔවුන් පවිත්‍ර කළ (විශුද්ධ කළ) මැනව කියා තම පියාණන් වහන්සේට යාච්ඤා කිරීම කොයිතරම් ආවශ්‍යද ..?

සත්‍යය පමණක් මනුෂ්‍යයන්ව විශුද්ධකරන්නේ නැත. අපි නොසෙල්වන ආදහිල්ලක් පවත්වාගෙන යා යුතුය. එසේ කිරීම ඉතා වැදගත්වේ. නමුත් එය අපගේ හදවතට ස්පර්ශ නොවන, අපගේ චරිතයට බලපෑමක් නොවන එකක් නම් ස්ථීර ලෙස අපි වැළඳගෙන සිටින ඇදහිල්ලේ වටිනාකම කුමක්ද ..? එය තමන් විසින්ම විශුද්ධ කරනු ලබන්නා වූ සත්‍යතාවය (ධර්මයක්) නොවන අතර පියාණන් වහන්සේ විසින් විශුද්ධ කරන්නා වූ ධර්මයයි. සත්‍යය ආත්මික බලයෙන් මනසට, හෘදය සාක්ෂියට සහ හදවතට යොමු කළ යුතුය. එසේ නොවන්නේ නම් මනුෂ්‍යයෙක් සත්‍යතාවය දැනගගත්තත් එයින් ප්‍රයෝජනය ලබා ගැනීමට නොහැකි වන්නේය.

නව ස්වභාවය මත දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ සෑම ක්‍රියාවක්ම අරමුණු කරන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය අයව පවිත්‍ර කිරීමට, කැප කිරීමට, පරිපූර්ණ කිරීමටය. අප වටා ඇති සියලුම සැපයීමේ සිදුවීම් සිදුකරනු ලබන්නේ මෙම අරමුණ උදෙසාය. මේ සඳහා අපගේ සතුට, අපගේ දුක, අපගේ ශරීරයේ වේදනාව, හදවතේ ශෝකය, අලාභ විඳ දරා ගැනීම සහ අපගේ කුරුස සියල්ලම කැපවීමෙන් කරන්නා වූ පූජාවන් වන්නේය. අපි ස්වභාවික රෝගයෙන් සුවය ලබන අතර පරිපූර්ණ ආත්මික සෞඛ්‍යය තත්ත්වයක් භුක්තිවිඳීමට සූදානම්ව සිටින්නෙමු. ස්වර්ගයට යන අපගේ මාවතේ අපට සිදුවන සියල්ල අපගේ ගමනේ අවසානය සඳහා ගැලපේ. කාන්තාරය හරහා අපගේ ගමන් මාර්ගය යන්නෙන් අදහස් කරන්නේ අපව පරීක්ෂා කිරීමට සහ අපව ඔප්පු කිරීමටත්, අපගේ නපුරුකම් සොයා ගැනීමටත්, පසුතැවිලිවීමත්, ජය ගැනීමටත් අවසානයේ දී සිංහාසනය ඉදිරියේ අපට නිදොස්ව සිටීමට හැකියාව ලබාදීමටත්ය.

අපි කොයි ආකාර වන්නෙමුදැයි තවම අපට නොපෙනේ. නමුත් අපි ඒ උදෙසා පොරබදිමින් සිටින්නෙමු. යේසුස් වහන්සේ ප්‍රකාශ වන විට අපි උන්වහන්සේ මෙන් වන බව අපි දනිමු. මක්නිසාද අපි උන්වහන්සේ සිටින ලෙසම උන්වහන්සේව දකින්නෙමු. අපි දැඩි පොර බැඳීමකින්, බොහෝ ආශාවෙන් බලා සිටීමකින්, බොහෝ ඉවසිලිවන්තකමෙන් රැඳී සිටීමකින් ශුද්ධකම උදෙසා නැගී සිටිමු. මෙම පීඩාවන් අපගේ තිරිඟු මඩිනු ලැබීමටත්, ගොයම් පාගා ගැනීමටත්. රත්තරන් වලින් අපවිත්‍ර ලෝහ අයින්කර දැමීමටත්, මහත් උපකාරකයක් වන්නෝය. දෙවියන් වහන්සේට ප්‍රේම කරන සියල්ලන්ට යහපත සඳහා සියල්ල එකට ක්‍රියා කරනු ලබයි. ඒ සියල්ලේ ශුද්ධ ප්‍රතිඵලය වනුයේ ලප හෝ කැළැල් හෝ රැළි හෝ එබඳු කිසිවක් නැතුව තෝරාගත් අය දෙවියන් වහන්සේ ඉදිරියේ සිටීමයි.

මාගේ සහෝදරයෙනි, දෙවියන් වහන්සේම ඔබ තුළ ක්‍රියා කළ යුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ වාසය කළ යුතුය. මෙය ඔබ වෙත පැමිණිය හැකිවන්නේ යේසුස් වහන්සේ කෙරෙහි ඔබ තුළ ඇති ඇදහිල්ලෙන් පමණි. ඔබේ සමාව සහ ධර්මිෂ්ඨ කරනු ලැබීම උදෙසා උන්වහන්සේව විශ්වාස කළාක් මෙන්ම ඔබේ විශුද්ධකරණය සඳහාත් උන්වහන්සේව විශ්වාස කරන්න. ඔබට විශුද්ධභාවය ලබාදිය හැකි වන්නේ උන්වහන්සේට පමණි. මක්නිසාද මෙය අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් දෙවියන් වහන්සේ අපට ලබාදෙන දීමනාවයි.

දෙවියන් වහන්සේගේ සත්‍යතාවය තුලින්

ඇදහිලිවන්තයන් විශුද්ධිකරණයට ලක්විය යුතු ආකාරය ගැන සැලකිල්ලට ගන්න. "ඔබගේ සත්‍යතාම තුළින් ඔවුන් පවිත්‍ර කළ (විශුද්ධ කළ) මැනව. මක්නිසාද ඔබගේ වචනය සත්‍යතාවයයි." ප්‍රේමවන්තයෙනි, දෙවියන් වහන්සේගේ ශුද්ධකම සහ සත්‍යය එකට එකතු කර ඇති ආකාරය දෙස බලන්න. කිතුණු ජීවිතය යනු සත්‍යයේ වර්ධනය වෙන ජීවිතයකි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මාර්ගය, සත්‍යය, ජීවනය වන අතර එම ත්‍රිවිධ චරිතය තුළම උන්වහන්සේව පිළිගනු නොලබන්නේ නම් නිසි ලෙස උන්වහන්සේව පිළිගත නොහැකිය. සත්‍ය නොවන දේ විශ්වාස කිරීමෙන් අප තුළ ශුද්ධ ජීවිතයක් බිහි නොවනු ඇත. තමා තුළින් (චරිතයෙන්) විශුද්ධවීම ප්‍රකාශ වෙන්නේ හදවතේ අභ්‍යන්තර ඇදහිල්ල ඇති කර ගැනීමෙනි. නැතිනම් එය නිශ්ඵල වන්නේය. යහපත් ක්‍රියා සැබෑ ඇදහිල්ල ඇතිකර ගැනීමෙනි. නැති නම් එය නිශ්ඵල වන්නේය. යහපත් ක්‍රියා සැබෑ ඇදහිල්ලේ ඵල වන අතර සැබෑ ඇදහිල්ල සත්‍යයේ අවංක විශ්වාසයයි. සෑම සත්‍යතාවයක්ම ශුද්ධත්වය කරා යොමු කරවයි. සත්‍යයට (දේව වචනයට) විරුද්ධ වන සෑම කාරණයක්ම සෘජුව හෝ වක්‍රව පාපයට යොමු කරවයි. මනුෂ්‍යාව විශුද්ධකරන සියලුම සත්‍යය දේව වචනයේ ඇත.

සත්‍යය යනු ඔබගේ හෝ මගේ මතය නොවේ. "ඔබගේ වචනය සත්‍යයතාවයයි." කියා යේසුස් වහන්සේ පැවසූ සේක. එම නිසා මනුෂ්‍යයන් විශුද්ධකරන දේ පමණක් නොව එය දෙවියන් වහන්සේගේ වචනයෙන් හෙළිවන විශේෂිත සත්‍යය වේ. එසේනම් මාගේ සහෝදරයෙනි, ඔබ කොපමණ උනන්දුවෙන් ශුද්ධ ලියවිලි සෙවිය යුතු දැයි ඉගෙන ගන්න. ඔබ කොපමණ උනන්දුවෙන් දෙවියන් වහන්සේගේ වචනය වන බයිබලය කියවිය යුතුද ? එය සත්‍යතාවය නම්, දෙවියන් වහන්සේ අපව විශුද්ධකරන සත්‍යතාවය නම් අපි එය ඉගෙන ගනිමු. එය අල්ලාගෙන එහි ස්ථීරව සිටිමු. සත්‍යය අපව සැබෑ ජීවිතයකට ගෙන යන බැවින් එහි පවතිමු. සත්‍යය සම්පූර්ණයෙන්ම භාවිතා කළ විට දිනපතා පාපය විනාශකර දමයි. කරුණාව පෝෂණය කරයි. උතුම් ආශාවන් යෝජනා කරයි. ශුද්ධ ක්‍රියාවන්ට පොළඹවයි.

අපගේ ජීවිත වලින් දෙවියන් වහන්සේගේ වචනය වන අපගේ ගැලවුම්කරුවාණන්ගේ අලංකාරය ප්‍රකාශ වන ලෙස මම යාච්ඤා කරමි. ඔබගේ වචනයෙන් අප විශුද්ධ කළ මැනව. මන්ද ඔබගේ වචනය සත්‍යතාවයයි.

"මාගේ ප්‍රිය දරුවෙනි, වචනයෙන්වත්, දිවෙන්වත් නොව ක්‍රියාවෙනුත්, සැබෑවෙනුත් ප්‍රේමකරමු." (1 යොහාන් 3:18)

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

පසුගිය කලාපයෙන්

හදවත නිදැල්ලේ යාමට හේතු .....

උපකල්පනය

පසුබටවීමට තවත් හේතුවක් වන්නේ පූර්ව නිගමනයයි. ආත්මය දෙවියන් වහන්සේ සමඟ ඉතා හොඳින් පවතින බව තැකීමට බොහෝ විශාල ඉඩක් ලබාදෙයි. ආරක්ෂක දේවදූතයා අකීනර සිත ඉවත්කිරීමට අමතර උත්සාහයක් ගනියි. ඔබ දෙවියන් වහන්සේගේ ඉතා ලැදි කෙනා බව සාතන් ඔබට කියයි. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අනිත් දරුවන්ට වඩා ඔබ ගැන සිතන බව සාතන් කියයි. අනිත් අයට නොදක්වන නිදහසට කරුණු දැක්වීමට ඔබට අවස්ථාව ලාබදෙනවා යැයි සාතන් කියයි.

සාලමොන්ට මේ ආකාරයෙන් පරීක්ෂාව පැමිණියේය. දෙවියන් වහන්සේ සමඟ උසස් ආකාරයේ සම්බන්ධතාවය සහ ඔහුට තිබුණු කිසිවෙකුට සමාන නැති ප්‍රඥාව සහ දැනගැන්ම ගැනත් දෙවියන් වහන්සේ සහතික වී තිබුණු සේක. ප්‍රඥාවන්ත මනුෂ්‍යයා දුහුවිල්ලේ සිට නිශ්ඵලකම්වල නිශ්ඵලකම යැයි මොරගසන තුරු සාතන් උපකල්පනයේ නූල් මත ඔහුගේ පරීක්ෂාකිරීම සිදු කළේය. නිශ්ඵලකම්වල නිශ්ඵලකමය, **"නිශ්වලකව්වල නිශ්වලකමය සියල්ලම නිශ්වලකම යයි ධර්මදේශක තෙමේ කියන්නේය."** (දේශනාකාරයා 1:2)

දේවමාළිගාවේ මුදුනේ සිට පහලට පනින ලෙස සාතන් යේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටි විට උන්වහන්සේට ඉදිරිපත් කළ පරීක්ෂාව මෙයයි. යේසුස් වහන්සේ පහළට පනින විට දේවදූතයන් උන්වහන්සේගේ පය ගලක නොවදින ලෙස ආරක්ෂා කරන තරමට දෙවියන් වහන්සේ යේසුස් වහන්සේ ගැන ප්‍රසන්න බව පැවසීය.

මෙම මූලධර්මයට ගණන් කළ නොහැකි තරම් යෙදුම් තිබිය හැකිය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමයේදී මෙන්ම, උන්වහන්සේගේ දඬුවම්වලදී ද අපක්ෂාපතීව සිටින සේක. මිහිපිට සිටින ලොකුම පව්කාරයා පවා පසුතැවිලි වන විට උන්වහන්සේ තම ආදරය පෙන්වන අතර උන්වහන්සේගේ සමඟ මුහුණට මුහුණලා කථා කළ උතුම් ශුද්ධවන්තයෙක් වූ මෝසෙස්ට ද දඬුවම් කළ සේක. උපක්ලපනය යනු යක්ෂයා සෑදු පාපය වන අතර සාතන් දේව දරුවන්ව රැවටීමට විවිධ කාරණා දහස් ගණනින් ඉදිරිපත් කරයි.

දුෂ්කරතා

කරුණාව නැතිවීමට තවත් හේතුවක් වන්නේ අපි අපගේ දුෂ්කරතා දෙස බැලීමයි. ජීවිතය දුෂ්කරතාවලින් පිරී ඇති බව අපේක්ෂා කළ යුතු අතර වැටුණු ලෝකයක ජීවත්වීමෙන් ඇගවෙන්නේ මෙයයි. ආත්මික ජීවිතය තුළ සමාව හෝ ශුද්ධකම සෙවීමේ දුෂ්කරතා ඇත. අපගේම මනසින් හෝ පරම්පාරවෙන් පැණ නගින දුෂ්කරතා අපගේ සමාජ වටපිටාව, අපගේ දිළිඳු සහ වැරදි ඉගැන්වීම් ගණන් කළ නොහැකි දුෂ්කරතා ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම වල්පැළෑටි වසන්තයක් මෙන් පවතියි. මෙම දුෂ්කරතා මත දෑස් තබා ගැනීම ඇදහිල්ල දුර්වල කරනු ලබයි. නොපසුබට උත්සාහය කරුණුකොටගෙන මනස එයින් වෙනතකට යොමු කරනු ලබයි. වළාකුල් දර්ශනය වී ආත්මය දේවයන් වහන්සේ වෙතට ඇද ගනියි. අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ තම දරුවන්ට දුෂ්කරතා ජාලයන් බොහෝ වාරයක් පාගා දැමීමට ඉඩ දෙන අතර දෙවියන් වහන්සේ ඒවා අපගේ ඇදහිල්ලේ පරීක්ෂණයක් ලෙස මොරගසමින් ජයග්‍රහණ ලැබීමට අවසර ලබා දෙන සේක. සාතන් එවැනි සිදුවීම් සමහර අකීකරුකම් සඳහා තර්කයක් ලෙස භාවිතා කරයි.

ආත්මයේ දැඩි බව

ආත්මයේ දැඩි බව සහ අනිත් අයව දැඩි ලෙස විනිශ්චය කිරීම තුලින් කරුණාව අහිමිවී ආත්මිකව වහල්භාවයට හසුවේ. තම ධර්මිෂ්ඨකම අන් අයව විශාල ලෙස විවේචනය කිරීමට මූලික වේ. අන්‍යයන්ව හෙළා දැකීම අපවම ප්‍රශංසා කිරීමේ පසුගාමී තත්ත්වයකි. අපි අනිත් අයව වටිනවා යැයි සිතන තරමටම අපි අපවම ඔසවා තබා ගැනීමට සිතන්නෙමු. තමාට ප්‍රශංසා කර ගැනීමකින් තොරව තවත් කෙනෙකුව නපුරු ලෙස කථාකල නොහැකිය. ශ්‍රේෂ්ඨ අධ්‍යාත්මිකත්වයක් ප්‍රකාශ කරන ආත්මයක් ඇති අය බොහෝ වාරයක් පාපය හෙළා දැක ඇත්තේ පාපයට වඩා වැඩි පාපිෂ්ඨ ආකාරයකින් පාපය හෙළා දැකීමෙනි. අනිත් අයව හෙළා දැකීම තරම් සියුම් භයානක දෙයක් මුළු කිතුණු ජීවිතය තුළම නොමැත. පැරණි අධ්‍යාත්මික ලේඛකයෙක් පවසා ඇත්තේ පාපය ගැන තවත් කෙනෙකුට තරවටු කිරීමට වෙනත් ඕනෑම රාජකාරියකට වඩා නිහතමානිකමක් අවශ්‍ය බවයි.

සමහර විට මනුෂ්‍යයා පව්කිරීම සහ තදින් පහරදීම ගැන කතා කරනවා අපට අසන්නට ලැබේ. නමුත් එවැනි ආකාරයේ ක්‍රියාවන් කඳුළුවලින් මොළොක් බවින් පෙගෙන්නේ නැති නම් පහර දෙන ආත්මය තැලීම් පමණක් වනු ඇත. සාතන්ව සිනහවට පත්කර ශුද්ධාත්මයාණන් වහන්සේව වේදනාවට පත්කරන තරම් ආත්ම ප්‍රසාද ස්වරයකින් පාපයේ භයානක ස්වභාවය දේශනා කළ හැකිය. තියුණු කඩුවකින්, ආකරුණික විවේචනයකින් දරුණු විනිශ්චයකින්, ප්‍රේමණීය නොවන හෙළා දැකීමකින් ප්‍රේමයේ පවිත්‍ර මිහිරියාව, දෙවියන් වහන්සේ සමඟ සමීප ගමන කොපමණ දහස්වාරයකින් අහිමිවී ගොස් තිබෙනවාද ..?

තම ධර්මිෂ්ඨකම සියුම් බව පැහැදිලිය. එය ඉහළ තත්ත්වයන්ට දිවයන අතර කාරුණාවේ ඉහළම තත්ත්වයට ඇතුල්වීමට උත්සාහ කරයි. සාතන් මෙපමණ කාලයක් ඔහුගේ ක්‍රියාව ප්‍රගුණ කර ඇති අතර ඔබ සාතන්ව සහ ඔහුගේ ක්‍රියාව හෙළා දකින තරමට ඔහු ගණන් ගන්නේ නැත. සාතන්ට ඔහුගේ සහතික ක්‍රියාවේ බිංදුවක් ඔබගේ හදවත තුළට දැමීමට හැකි නම් ඔබට දැඩි ප්‍රහාරයක් (හදිසි විපත්තියක්) ඇති කළ හැකිය.

ආත්මයේ සැහැල්ලුබව

පසුබැසීමට ආත්මයේ සැහැල්ලු බව හේතු අතර අවසාන හේතුව ලෙස මම සඳහන් කරන්නෙමි. මෙය පැහැදිලිවම රළුකමේ ප්‍රතිවිරුද්ධත්වයයි. මෙයට සමහර අය දැඩි ලෙස නැඹුරු නොවේ. මොවුන් ඉතා සුළු විහිලු සිනහවකින් වැනි දෙයකින් දෙවියන් වහන්සේගෙන් ඈත්වීමට ඉඩ ඇති අතර සාතන්ගේ අරමුණට සමානව සේවය කරයි. විහිළුවකින් සරදමකින්, මහා හඩින් සිනහවකින් හෝ රළු ඉරියව්වකින් ආත්ම සියගණනක් දෙවියන් වහන්සේ සමඟ තිබූ පංගුකාරකම බිඳ දමා ඇත. නරකම විපත්තිය නම් මේ දේවල් තේරුම් ගැනීමට කිතුණුවන් ස්වල්ප දෙනෙක් පමණක් දෙවියන් වහන්සේට සමීපවීමයි. දෙවියන් වහන්සේ පිළිබඳව සිතේ ඇති සිහි කල්පනවා බිඳදමන ඕනෑම දෙයක් ආත්මයේ උසස් නිශ්කලංක ඇගයීමට බාධා කරයි. එය නිදැල්ලේ යාමේ ආරම්භක ලක්ෂණයකි.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

"මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ඔවුන්ට ප්‍රීතිවන්ට සලස්වන්නෙමි." (යෙසායා 56:7)